*2016 ජනවාරි මස 12 වෙනි අඟහරුවාදා දින*
*2016 ஜனவரி மாதம் 12 ஆம் திகதி செவ்வாய்க்கிழமை* ***Tuesday***
***12 th January 2016***

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සියළු දෙනාටම සුභ උදෑසනක් වේවා ! ඒවගේම සියළු දෙනාටම ලැබුවා වූ 2016 නව වසර සියළු බලාපොරොත්තු ඉෂ්ඨ වන නිරෝගිමත් සුභම සුභ නව වසරක් වේවා කියලා සියළු දෙනාටම ප්‍රාර්ථනා කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යතුමන්ලා, ඒවගේම ගරු විපක්ෂනායකතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුව තිබෙන්නේ ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් :**

ඒ යටතේ කිසිවක් වාර්තා වී නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ :**

ඒ යටතේ කිසිවක් වාර්තා වී නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන :**

13 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ ව්‍යවස්ථාවේ (3) අනුව්‍යවස්ථාව යටතේ සබරගමු පළාත් සභාවේ අදහස් පිළිබඳව ප්‍රකාශයන් ලබාගැනීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමන් විසින් සබරගමුව පළාත් සභාවට යොමු කරනු ලැබ තිබෙන බව සබරගමු පළාත් සභා කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ(65)1 වගන්තිය අනුව සභාවට දැනුම් දෙනවා. මේ අනුව මෙම පනත් කෙටුම්පත භාෂාත්‍රයෙන් සකස් කරන ලද පිටපතක් න්‍යාය පත්‍රය සමග ඔබතුමන්ලා වෙත මේ වෙන කොට ලබාදීමට කටයුතු කරලා තියෙනවා.

කාර්ය පටිපාටි රීති (65)2 අනුව මෙම ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත 65(2) අනුව ප්‍රඥප්ති සහ රීති කාර්ය සභාවට යොමු කර ලබන සභා වාරයට මෙය ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ඉෂ්ඨ කරනවා.

මීළගට සබරගමු පළාත් සභා කාර්ය රීති සංග්‍රහයේ රීති අංක (13)1 අනුව 2016 වසර සඳහා රජයේ සහ බැංකු නිවාඩු අතහැර 2015.11.26 වෙනිදින පැවති සභා කටයුතු සහ පහසුකම් පිළිබඳ කාරක සභාවේ අනුමත කර ගන්නා ලද 2016 වසරේ මුල් මාස හය තුළ සභා රැස්වීම සඳහා නියමිත දිනයන් සහිත ලිපිය ඔබතුමාගේ සහ ඔබතුමියගේ දැන ගැනීම සඳහා මේ වෙන කොට ලබාදීමට කටයුතු කරලා තියෙනවා.

මීළගට පාර්ලිමේන්තුවේ අදහස් විමසීම සඳහා ඉදිරිපත් කරන ලද සබරගමු පළාත් සංචාරක අධිකාරියේ ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ ලබාගැනීමට දියයුතු කාල සීමාව 2016 ජනවාරි මස 29 වෙනිදින තෙක් දීර්ඝ කර දෙන ලෙස ගරු පාර්ලිමේන්තුවේ ගරු කථානායක තුමාගේ නියෝගය පරිදි පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා විසින් මෙම ගරු සභාවේ ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ පිළිබඳව දින ලබාදීම පිළිබඳව සභාවේ විරුද්ධත්වයක් තියෙනවද? විරුද්ධත්වයක් නැති බවයි හැඟී යන්නේ.

ඒ අනුව පාර්ලිමේන්තුවේ කථානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා විසින් ඉල්ලා ඇති සබරගමු පළාත් සංචාරක අධිකාරියේ ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ නිරීක්ෂණ ලබාදීමට 2016 ජනවාරි මස 29 වෙනිදා දක්වා කල්දීමට මෙම ගරු සභාවේ යෝජනාව ලබාදීමට අපි කටයුතු කරනවා.

**නොපැමිණ සිටීමේ අවසර පිළිබඳ යෝජනා :**

***ගරු ආ.ප.සංවිධායක හර්ෂ සියඹලාපිටිය***
***கௌரவ அரச.க.அமைப்பாளர் ஹர்ஷ சியம்பலாபிடிய***
*Hon.Gov.Whip Harsha Siyambalapitiya*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, නිලන්ත ජයසිංහ මන්ත්‍රීතුමා අද දින නිවාඩු ඉල්ලා තිබෙනවා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ජයතිස්ස රණවීර මන්ත්‍රීතුමා අද දින නිවාඩු ඉල්ලා තිබෙනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

ඒ සියළු දෙනාට නිවාඩු ලබාදීම සුදුසු යැයි යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ඒ නම් ඉදිරිපත් කරන ලද සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ලබාදීමට කටයුතු කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :**

ගරු මන්ත්‍රී සිරිපාල කිරිඇල්ල මැතිතුමා, ඒවගේම ආරියවංශ බාලසූරිය මැතිතුමා ඒවගේම කේ.එල්.රත්නායක මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපි සඳහා පිළිතුරු ලැබී තිබෙනවා. අපි ඔබතුමන්ලාට ඒ ලිපි ලැබීමට සලස්වා තිබෙනවා.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :**

මේ යටතේ පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය කෙටුම්පත සඳහා නිර්දේශ ලබාදීමට පත් කළ කමිටුවේ නිර්දේශ මේ වනවිට පත් කරන ලද කමිටුව මා වෙත ලබාදී තිබෙනවා. ඒ අනුව මේ භාර දෙන ලද කමිටුවේ වාර්තාව තවදුරටත් මේ පිළිබඳ පක්ෂ සහ විපක්ෂ හිටපු පළාත් පාලන නියෝජිතයින් වෙත ඉදිරිපත් කර ඒ අයගෙන් තවදුරටත් ඉදිරිපත් කිරීමට යම් යෝජනාවක් හෝ යම් සංශෝධනයක් තිබෙනවා නම් ඒ සඳහා ඉදිරිපත් කිරීමට අපි සතියක කාලයක් ලබාදීලා තියෙනවා. අපි ඔබතුමන්ලාටත් දැනුවත් කරනවා තවදුරටත් එහි පිටපත් තමුන්නාන්සේලාට ලැබීමට සලස්වනවා. ඒ පිළිබඳව තවදුරටත් යම් සංශෝධනයන් තියෙනවා නම් සතියක කාලයක පස්සේ අපි ඊළඟ සභා වාරයට කමිටුවේ වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

**පෙත්සම් :**

පෙත්සම් ඉදිරිපත් කිරීම යටතේ ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමාට පෙත්සමක් ඉදිරිපත් කිරීමට අවස්ථාව.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි බලංගොඩ හඳගිරියේ පදිංචි ඩබ්. උදය අජිත් පාලිත මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම පල්ලේබැද්ද බලවින්න 134/3/බී හි පදිංචි එල්.එච්.පද්මතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම ඕපනායක දකුණු හුණුවල පාලම අසල නො:78,ඒ/2 හි පදිංචි එච්.පී.විමලරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම යන පෙත්සම් තුන පිළිගන්වනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම් පෙත්සම් කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**ප්‍රශ්න:**

ප්‍රශ්න ඉදිරිපත් කිරීම යටතේ ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/14 දරණ ප්‍රශ්නය සඳහා පිළිතුරු ලැබී තිබෙනවා. ඔබතුමාට අවස්ථාව. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අහලා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒකට පිළිතුරු එවා තිබෙනවා. ඔබතුමාට අවස්ථාව තියෙනවා ගරු මන්ත්‍රීතුමා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

---

ගරු සභාපතිතුමනි ඒ සඳහා ලිඛිතව පිළිතුරු ලබාදී තිබෙනවා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

පිළිතුරු ලැබී නැහැ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

සභා ලේකම්තුමා මට වාර්තා කරලා තියෙනවා පිළිතුරු ලැබී තිබෙනවා කියලා. ඒක එතුමාට ලැබෙන්න සලස්වන්න.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

පිළිතුරු අවශ්‍යයි වාචිකව. අපිට ඒක වාචික දෙනවා නම් අපිට අතුරු ප්‍රශ්න

අහන්න අයිතියක් තියෙනවා. ලිඛිතව ආපුවහම ආයෙත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න ඕනේ අතුරු ප්‍රශ්න වලට.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

දැන් ඔබතුමාට අවශ්‍යයිද ?

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---------------------------------------------------------

මම මොකුත් දන්නේ නෑ. දැන් පිළිතුරු කියවන්න වෙලාවකුත් නෑ. දැන් අපි බලාපොරොත්තු වෙන්නේ මීට පස්සේ ප්‍රශ්නයක් වාචිකව ඇහුවහම වාචිකවම පිළිතුරු මේ සභාවේ දෙනවා නම් මට නෙමෙයි වෙනත් ආණ්ඩු පක්ෂයේ හෝ මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් තියෙනවා නම් ඒ පිළිබඳව අතුරු ප්‍රශ්නයක් අහන වාරයේදී ඒක ඇසීමේ අවස්ථාවක් අපේ අයිතිය පිළිබඳව රැකවරණයක් තිබෙනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

---------------------------------------------------------

පිළිතුරු අපේක්ෂා කරන ආකාරය ලිඛිත. ඒ ලිඛිත පිළිතුරු දීලා තියෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

හරි දැන් ඔබතුමාගේ ප්‍රශ්නයට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලිඛිතව පිළිතුරු ඉදිරිපත් කිරීමක් කරලා තියෙනවා. අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් අපි නිවැරදි කිරීමට කටයුතු කරන්නම්. ඔබතුමා දැන් මේ ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරනවද. නැත්නම් ඊළග සභාවට ගන්නවද. හරි බොහොම ස්තුතියි.

මීළඟට නැවතත් ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න අංක 6/1/2015/15 දරණ ප්‍රශ්නය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් කරන ලද ඉල්ලීමට අපිට පිළිතුරු ලැබී නැහැ. ඔබතුමා ඉදිරිපත් කරනවා අපිට පිළිතුරු එවීමට කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමා පිළිතුරු එවා නැහැ. එවීමෙන් පසුව ඔබතුමාට එවීමට කටයුතු කරනවා.

මීළඟට ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/17 දරණ ප්‍රශ්නය සඳහා පිළිතුරු ලැබී නැත. ගරු අධ්‍යාපන තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් තමයි අහලා තියෙන්නේ. එතුමා සභාවේ නෑ. මේ වනතුරු අපිට පිළිතුරු එවලා නෑ. එවීමෙන් පසුව අපි ඔබතුමාට එවීමට කටයුතු කරන්නම්.

මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/19 දරණ ප්‍රශ්නය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් කරන ලද ප්‍රශ්නයට එතුමා පිළිතුරු ලබාදී තිබෙනවා. එය ලැබුණාද ඔබතුමාට. ලැබී නැහැ. එයත් ඔබතුමාට ලැබීමට සලස්වනවා. ඊළඟ සභා වාරයේදී ඒ පිළිබඳව ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නම්.

මීළගට ගරු විපක්ෂනායක ඩබ්.සෝමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/23 දරණ ප්‍රශ්නය සඳහා පිළිතුරු ලැබී තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාට

ලැබුණද ගරු විපක්ෂනායකතුමා. කතා කරන්න තිබෙනවාද ?

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

ඒගැන විස්තරයක් සභාවට ප්‍රකාශ කරන්න අවශ්‍යයි ගරු සභාපතිතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

ඔබතුමාට පිළිතුරු ලැබී තිබෙනවානේ. ප්‍රශ්නයක් අහන්න අවශ්‍යද?

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*
-----------------------------------------------------------

සභාවේ කතා කළ යුතු දෙයක් තිබෙනවා. ඒක පිළිතුරෙන් සෑහීමට පත් වෙන්න බෑ. ගරු සභාපතිතුමනි කෑගල්ල පේෂ කර්මාන්ත සමිතිය හා පැරණි ගොඩනැගිල්ල වසා දැමීම නිසා රු.60000/- කට වැඩි මුදලක් පේෂ කර්මාන්තයට අහිමි වෙන අතර, නිෂ්පාදනය කරන රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් නොමැතිකම නිසා සේවිකාවන් 21 දෙනෙකුගේ රෙදි වියන්නන් සහ සේවකයන් 75 දෙනෙකුගේ රැකියා අහිමි වෙන තත්ත්වයක උද්ගත වෙලා තියෙනවා. ඉහත ලක්සල ගොඩනැගිල්ල දේශපාලන හිතවතුන්ට ලබාදීමේ සූදානමක් ඇති බව ජනතාව පවසයි. පිළිතුරු ලැබිලා තියෙනවා මට මේ ලක්සල ගැන කතා කරන්න තියෙන්නේ ගරු සභාපතිතුමනී මෙය දියුණු කර ගන්න අවශ්‍යතාවය තියෙනවා. මේ ලක්සලෙන් මං හිතනවා සමහරවිට කෑගල්ල මධ්‍යස්ථානයෙන් පාඩු ලබන්න පුළුවන්. මේ පාඩු ලබන්න සිදු වෙලා තිබෙන්නේ තරඟකාරී වෙළඳ ලෝකයේ අද විශේෂයෙන් රෙදි නිෂ්පාදනය දිහා බලන කොට විදේශීය රටවල් වලින් ගෙනල්ලා මීට වඩා ලස්සන තියෙන භාණ්ඩ අඩු මිළට අලෙවි කිරීමක් තියෙනවා. අපේ පළාත් සභාවට මේ ගැන කතා කරන්න මගේ බලාපොරොත්තුවක් තිබුණා. පෙන්වලා දෙන්න බලාපොරොත්තුවක් තිබුණා. මීට වඩා මේ කාර්ය ඉහළින් නිම කර ගන්න පුළුවන් විදිහට මේ පරිපාලනයේ නිළධාරින්ට ලැබුණොත් හොඳයි කියන පනිවිඩය මේ සභාවට දෙන්න බලාපොරොත්තුවක් තිබුණා. ඒක තමයි මේ ප්‍රකාශ කලේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

ගරු ප්‍රධාන අමාත්‍යතුමා තවදුරටත්.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ ප්‍රශ්නය යොමු කරලා තියෙන්නේ මා වෙත. නමුත් මම පිළිතුරු ලබලා දීලා තියෙනවා. මේ ලක්සල ගොඩනැගිල්ලත් මේ ලක්සල පරිපාලනයත් අප අමාත්‍යාංශයෙන් අදාළ කරන කාර්යක් නෙමෙයි. මේ ලක්සල ආයතනය මහ ආණ්ඩුව සම්බන්ධ වෙලා කරන කාර්යක්. නමුත් අපේ අමාත්‍යාංශයේ විෂයපථයට අයිති දෙයක් නෙමෙයි. ඒ නිසා මම ඔබතුමාට පැහැදිලි කරන්නේ පිළිතුරක් ඔබතුමාට එවලා ඇති.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු අමාත්‍යතුමනි.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :**

කිසිවක් වාර්තා වී නැහැ.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*
*கௌரவ நமிந்த அனுரபிரிய*
*Hon.Member Naminda Anurapriya*

---

සුභ නව වසරක් සියළුම දෙනාට. අද පළාත් සභාවට එන කොට ඇත්තටම පාර්ලිමේන්තු ආකෘතියකට එනවා වගේ තමයි දැක්කේ. ඒ නිසා සභාපතිතුමා ඇතුළු ඒ කටයුතු කරපු ගෞරවාන්විත අභිමානවත් ආකාරයට පළාත් සභාවක් ආරම්භ කරපු ව්‍යුහය ඇති කරපු ඔබතුමාට පළමුව මම ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි මගේ පෞද්ගලික ප්‍රකාශ කිරීම. මමත් ගිය සතියේ වාසුදේව නානායක්කාර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් අපේ මහජන හමුවීම් සඳහා ඇඹිලිපිටිය ප්‍රදේශයට ගියා. ඒ ගිය අවස්ථාවේ ඇත්ත වශයෙන්ම ඇඹිලිපිටිය නගරයේ විශාල උද්ඝෝෂණයක් තිබුණා. ඒකට හේතුව ඒ ඇඹිලිපිටිය නගරයේ මංගල අවස්ථාවක් සඳහා සහභාගි වෙච්ච රාත්‍රී කාලයේ ඒ සාදය අවස්ථාවේදී සහභාගි වෙච්ච අයට පහරදීමකට ලක් වෙලා බිල්ඩින් එකක් පල්ලෙහාට වැටිලා ඒ තුළින් මිය ගිය තරුණයාගේ අභාවය පිළිබඳව තමයි ඒ අවස්ථාවේදී මහා උද්ඝෝෂණයක් තිබ්බේ ගරු සභාපතිතුමනි. ඇත්තටම ඒ ප්‍රදේශයේ ඒ පවුලේ සියළු දෙනාම කියන්නේ මේ පොලීසිය විසින් තමයි ඒ තරුණයාව තට්ටු තුනක් උඩ බිල්ඩිමක් උඩ ඉඳලා තමයි මේ තරුණයාව ගහලා ඇදලා දාලා මරලා දැම්මේ කියලා කෙලින්ම චෝදනාව ඇඹිලිපිටිය පොලීසියට කෙලින්ම චෝදනාව එල්ල වෙනවා. ඒ වෙනුවෙන් විශාල ජනතාවක් සාක්ෂි කියනවා. ඒ නිසා ඇත්ත වශයෙන්ම අද පොලීසියේ ක්‍රියාදාමය අපි තරයේ හෙළා දකිනවා. විශේෂයෙන්ම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කර සිටිනවා අපේ පොලීසිවල කටයුතු මෙවැනි ආකාරයේ ශෝචනීය ආකාරයෙන් කටයුතු කිරීම හෙළා දකිනවා සබරගමුවේ ජනතාව හැටියට.

ඒවගේම ගරු සභාපතිතුමනි මේ පොලීසිවල ඇඹිලිපිටිය පොලීසියේ පමණක් නෙමෙයි තවත් පොලීසි ගණනාවක මේ තත්ත්වය උදා වෙමින් පවතිනවා. දැන් සාමාන්‍ය මිනිහෙකුට පතලක් කපා ගන්න විදිහක් නෑ. අලුත් අලුත් දඩ ක්‍රම එනවා. ඇකිල්ල මිටියක් කපා ගන්න විදිහක් නෑ පොලීසියෙන් අල්ලනවා. අපේ ප්‍රදේශයේ එක්කෙනෙකුට රු.30000/- ක් කැකිල්ල මිටියක් අරගෙන යන කොට දඩ ගහලා තියෙනවා. මේවා කවදාකවත් වුණේ නෑ මේක සම්ප්‍රදායික කර්මාන්තයේ. ඒ නිසා මේ පොලීසිවල අලුත් නීති හදාගෙන අලුතින් මහජනතාවට ගේන පීඩනය වාහම නතර කරන්නට අපි පළාත් සභාවක් හැටියට අපි තරයේ හෙළා දකිනවා සහ මම පෞද්ගලිකව ප්‍රකාශ කරනවා මේ ඇඹිලිපිටියේ ඝාතනය පිළිබඳව . ඇඹිලිටියේ පොලීසියේ ස්ථානාධිපතිතුමා ඇතුළු ඒ වගකිව යුතු සියළු දෙනාම වහාම ඒ ස්ථානයේ ඉවත් කරලා මේ පිළිබඳව වහාම පරීක්ෂණ පවත්වන්න කියන කාරණාව මම මේ සභාවට මතක් කර සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමනි. විපක්ෂ සංවිධායකතුමා ඔබතුමාට අවස්ථාව.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අසාධාරණය සම්බන්ධව කතා කරන්න අපිට අවස්ථාවක් ඉල්ලනවා ඔබතුමාගෙන්. මොකද මෙවැනි අසාධාරණයක් නිසා තමයි ගරු සභාපතිතුමනි මම 1993 පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉල්ලන්න ආවේ. ඒ බැඳගත්ත උරවක්‍ර මාලය තාම තියෙනවා අවුරුදු විසිතුන හමාරක්. මොකද සාධාරණව ස්වාධීනව හම්බ කර ගත්ත දෙයින් රටේ ජනතාවට යමක් දුන්නහම ඒක කතා කළහම පොලීසියේ කූඩුවට දැම්මා. මේක අහපුවහම කැකිල්ල රජ්ජුරුවන්ගේ නීතියක්. නඩුකාර උන්වහන්සේ නිදොස් කොට නිදහස් කළා තරයේ අවවාද කරලා පොලීසියට. මේක ගැන අපි විශේෂයෙන් කතා කරන්න ඕනේ.

දැන් ගරු සභාපතිතුමනි මට ඒ සිද්ධිය වුණා. මන්ත්‍රීවරයෙක් වශයෙන් මම එදා අද වෙනකන් මේකේ ඉන්නවා. අසරණ ජනතාවට කවුද කියන්නේ. ඇඹිලිපිටියේ කතාව ගත්තහම ගරු සභාපතිතුමනි මම පත්තර පිටුවත් සමග සභාගත කරනවා මේක. මෙතන විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තියෙනවා. මේ පුද්ගලයා උඩ ගිහිල්ලා තුන් හතර දෙනෙක් එක්ක ඒගොල්ලන්ගේ විනෝදයට මොනවා හරි බීලා තියෙනවා. මත්පැන් හරි ඒගොල්ලෝ ප්‍රසිද්ධියේ පාරේ බිව්වා නෙමෙයිනේ. උඩ මහලකනේ. එතෙන්ට ගිහිල්ලා මේඅයත් බොන්න ඉල්ලුවා කියලා කියන්නේ. අපි හරියටම සාක්ෂි දන්නේ නෑ. ඊට පස්සේ දුර දිග ගිහිල්ලා ඉවර වෙලා ඒ පුද්ගලයා තල්ලු කලා කියලා තමයි පත්තරේ බලාපුවහම තියෙන්නේ. ඒ නිසා පොලීසිය මේවගේ අතලොස්සක් සුළු පිරිසක් එක්කෙනෙක්ගේ දෙන්නෙගේ පහත් වැඩ නිසා සභාපතිතුමනි මුළු පොලිස් සංහතියටම වදිනවා. ඇරත් එතන මම තව දකින දෙයක් තියෙනවා ගරු සභාපතිතුමනි ඒ පුද්ගලයාගේ ඝාතනය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරලා ඒවාට කටයුතු කරනවාද කියලා අපි විශ්වාස කරනවා. විසි දෙනෙක්ද කොහේද ස්ථාන මාරු කරලා තියෙනවා. අනිවාර්ය නිවාඩු යවලා තියෙනවා ඒ.එස්.පී. මහත්තයා. මෙතන මම දකිනවා ජනතාවගේ පැත්තෙන් ජනතාව කුපිත වුණහම වෙන දේ මොනවද කියලා දන්නේ නෑ. ඒ නිසා ඒ සියල්ලටම හේතුව සාමය ආරක්ෂා කරන්න ඉන්න පොලිස් නිළධාරියාගේ යම් යම් අන්තනෝමතික ක්‍රියා නිසා ගරු සභාපතිතුමනි මේවා සිද්ධ වෙලා තියෙන්නේ. දැන් මෙතන මම විශේෂයෙන්ම උලුප්පලා පෙන්වන්නේ එක කාරණයක්.රජයේ දේපළ කිව්වහම පොඩ්ඩක් මගේ කතාවෙන් පස්සේ කතා කරන්න ගරු මන්ත්‍රීතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

මන්ත්‍රීතුමා පෞද්ගලික ප්‍රකාශ කිරීම් ඉවර කරන්න

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

දේශපාලනයට යට වෙච්ච පොලීසියක් තියෙන නිසා තමයි මේ ඔක්කෝම ප්‍රශ්නය.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

නෑ නෑ එහෙම කතා කරන්න එපා. එහෙම කතා කරන්න ගියොත් මේකේ අලගිය තැන් මුල ගිය තැන් ඔක්කෝම කියන්න වෙනවා. එක්කෙනෙක්වත් මාරු කරලා නෑ. 2015.01.08. වෙනිදා පස්සේ කිසිම කෙනෙක් මාරු කරලා නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

සිරිපාල මන්ත්‍රීතුමා ඔබතුමා පෞද්ගලික ප්‍රකාශ කිරීම් ඉවර කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මම මේ කියන්නේ මෙතන ජනතාව කුපිත වෙච්චි දෙයින් සිදු වෙච්ච දෙයක් බව අපි පිළිගන්නවා. නමුත් රජයේ දේපළ කිව්වහම අපි කාගේත් අයිතියක් තියෙනවා. පාරක් හදන්න කිලෝමීටරයකට කෝටි ගාණක් වැය වෙනවා නම් ඒ පාර උඩ ඇවිල්ලා ටයර් පුච්චනවා නම් ගිනි තියනවා පාර විනාශ කරනවා නම් ඒක නොහිබිනා ක්‍රියාවක් ගරු සභාපතිතුමනි. මේ රටේ සම්පත්. මේවා ආරක්ෂා කර ගන්න ඕනේ. හැබැයි මේ සියල්ලක් සිදු වෙන්න හේතුව තමයි අර පොලීසියේ යම් කීප දෙනෙක්ගේ වරදක්. ඒ වරද නිසා මේ දේ සිද්ධ වුණා. එහෙම නම් මේ දේ සිදු නොවෙන්න වගබලා ගන්නට ඕනේ කියන එකයි ගරු සභාපතිතුමනි කියන්නේ. අපි ඒ සම්බන්ධව පරීක්ෂණයක් කරලා ඒ අයගේ අනිවාර්ය නිවාඩු ඇරලා තියෙන නිසා මේ අය ගැන කතා කරන්න බෑ. නඩුවක් තියෙන නිසා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඒ එදා සිදුවීම ගැන. මේ රජයේ දේපළ. පාරක් කිව්වහම කෝටි ගාණක් වියදම් කරලා කාපට් පාරක් හදන්නේ. ඒ පාර ටයර් දාලා ගිනි තියලා කවුරු හරි කුලප්පු කරලා මේවා විනාශ කරනවා නම් ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියන එකයි ගරු සභාපතිතුමනි ඉල්ලන්නේ. මම මේ ගැන හදාපු ලිපිය තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා සභාගත කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

ස්තුතියි ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. මීළඟට රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මාස දෙකකට ඉහතදී මට තිබූ රෝගයක් සම්බන්ධව කනේ අමාරුවක් සහ උගුරේ රෝගයක් සඳහා නවලෝක රෝහලේ ප්‍රතිකාර ගත්තා නතර වෙලා. හවස හතර හමාරට තමයි ඇඩ්මිට් වුණේ. දවස් දෙකක් ඉඳලා රෑ එකළොහ හමාරට වෛද්‍යවරයා මාව ටිකට් කැපුවා. ඒ වෙලාවේ මම අදාළ රක්ෂණ සමාගමට මම කිව්වා ටිකට් කැපුවා කියලා. ඒ අවස්ථාවේදී

දුරකථනයෙන් එදා රාත්‍රියේ හිටපු අය කිව්වා මුදල් අංශයට ගිහිල්ලා යන්න කියලා. එතනට ගියාට පස්සේ ටෙලිෆෝන් එකෙන් කතා කරලා කිව්වා මම බෙහෙත් බීලා නැති හන්දා මුදල් ගෙවන්න විදිහක් නෑ කියලා. මට යන්න දෙන්න විදිහක් නෑ කියලා. ඒ අවස්ථාවේදී මම ඉතාමත් අසරණ තත්ත්වයට පත් වුණා. මම සල්ලි අරගෙන ගියේ නෑ ගරු සභාපතිතුමනි. එදා රෑත් නවලෝකේ බංකුව උඩ වාඩි වෙලා ඉඳලා පහුවදා උදේ ගෙදරින් සල්ලි ඉල්ලගෙන තමයි බිල ගෙවලා ආවේ. අහන කොට කිව්වේ රෝගය පරීක්ෂා කරලා මට මාස තුනකට බෙහෙත් දුන්නා. ඒ වෙලාවේ රෝහලෙන් බෙහෙත් දුන්නේ නැති හන්දා බිල ගෙවන්න බෑ කිව්වා. මම මේ සියළුම මන්ත්‍රීවරුන්ගෙන් දැනුම සඳහා කියන්නේ මෙවැනි දෙයක් සිදු වුණහම එක පාරට අසරණ වෙනවා. රක්ෂණ සංස්ථාවෙන් ඇහුවහම කියන්නේ ඒ සඳහා වෙනම ආවරණයක් තියෙනවා ඒකට ඇතුල් කරන්න කියලා. ඊට පස්සේ මම සම්පූර්ණ බිල්පත් ටික සභාලේකම් කාර්යාලයට භාර දුන්නා. ඒ ඇරලත් මාස දෙකක් වෙනවා. මේ දක්වා කිසිම ගෙවීමක් ලැබුණේ නෑ ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

හරි එකක් තමුන්නාන්සේට සිදු වෙච්ච කාරණය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා යම්කිසි ආත්ම ගරුත්වයට යම්කිසි හානියක් වෙන ආකාරයට ඒ රක්ෂණ සමාගම කටයුතු කරලා තියෙනවා නම්. සාමාන්‍යයෙන් ඔය වගේ කතාවක් පළවෙනි වතාවට තමයි අපිට චෝදනාවක් ලක් වෙලා නෑ කිසිම වෙලාවක මේ කටයුතු සම්බන්ධයෙන්. මොකද ශ්‍රීලංකා රක්ෂණ සමාගම මේ කටයුතු කරන්නේ. දිගටම මේ කටයුතු සම්බන්ධීකරණය කරගෙන ආවේ ඒ ආයතනය. ඒ නිසා ඔබතුමාට වෙච්ච කාරණාව පිළිබඳව විධිමත්ව සොයලා බලලා මට පනිවිඩය දැන ගන්න ලැබුණා ඒ රක්ෂණ සමාගමේ නියෝජිතයෙක් කැඳවන්න මෙහේට කියලා. මෙතන යම් ගැටළුවක් තිබෙන බව පේනවා පහුගිය කාලයේ සෘජුව නියෝජිතයෙක් මේ වෙනුවෙන් පෙනී සිටලා තියෙනවා . හැබැයි දැන් අවසාන කාලය වෙන කොට නියෝජිතයෙක් පෙනී සිටීම පිළිබඳ යම් ප්‍රශ්නයක් පැන නැගලා තියෙනවා. ඒ නිසා ඒ ගැන සාකච්ඡා කරලා අනිත් කාරණය තමයි තමුන්නාන්සේලා ආවරණය වෙන කොටස් ටික මොනවද කියලා තමුන්නාන්සේලාට ලබාදීමටත් කටයුතු කරනවා. තමුන්නාන්සේලාව රක්ෂණය කරලා තියෙන්නේ මොන මොන කොටස් යටතේද කියන එකත් තමුන්නාන්සේලාට ලබාදීමට කටයුතු කරලා තියෙනවා. කෙසේ වෙතත් මේකට තමුන්නාන්සේට වෙච්ච කාරණය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරලා. මින් ඉදිරියට මේවගේ නොවෙන්නටත් මේ කාරණාව පිළිබඳව තවදුරටත් කටයුතු කිරීමටත් කටයුතු කරනවා කියලා මතක් කරනවා. මීළඟට තියෙන්නේ ශෝක ප්‍රකාශ යෝජනා ..

***ගරු ප්‍රධාන අමාත්‍ය*** *මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

---

මට ඉදිරිපත් කරන්න තියෙන්නේ ..

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ගරු ප්‍රධාන ඇමතිතුමා න්‍යාය පත්‍රයේ තව දෙකක් තියෙනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා :**

ඒ යටතේ කිසිවක් වාර්තා නෑ.

**පොදු කටයුතු ආරම්භයේ දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා :**

කිසිවක් නෑ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා :**

මේ යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

-------------------------------------------------------

පොදු කටයුතු ආරම්භයේ දැනුම්දීමක් ලෙස ගරු සභාපතිතුමනි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ බදු අයකිරීම හා වාර වාර්තා ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ,

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය විධිමත්ව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා පහ මෙම ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා මම සභාගත කරනවා.

***ගරු සභාපති** කංචන ජයරත්න*
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

ස්තූතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද සියළුම ව්‍යවස්ථාවන් පිළිබද සාකච්ඡාව අපි මීළඟ සභා වාරයට ගැනීම සඳහා යෝජනා පරිදි අපි කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

මම මීට ඉහතදී ප්‍රකාශ කළා පළාත් පාලන ආයතන නියෝජිතයින් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය කෙටුම්පත පිළිබඳව කමිටු වාර්තාව ලැබීමෙන් පසුව කමිටු වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා මේ වෙන කොට සතියක කාලයක් ලබාදීලා තියෙනවා. ඒ කාලය ලබාදීමෙන් අනතුරුව ඊළඟ සභාවට මේ කාරණය සාකච්ඡා කිරීම සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.

මීළඟට 14.2 යටතේ සබරගමු පළාත් ප්‍රජා ගුවන්විදුලි සහ රූපවාහිනී මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳව ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ අවස්ථාව. මේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබාදෙනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***

*Hon. Chief Minister Mahipala Herath*

-------------------------------------------------------

ගරු සභාපතිතුමනි සබරගමු පළාත් සභාවේ ගුවන්විදුලි සේවයක් සහ රූපවාහිනී සේවයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ධවල පත්‍රිකාව අපි මේ සභාව වෙත සභාගත කරනවා. මම විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි අපි අනිකුත් පළාත් සභාවල ගුවන්විදුලි සේවාවක් තිබෙන අතර, අප පළාත් සභාවේ අපි ගුවන්විදුලි සහ රූපවාහිනී සේවයක් යන කරුණු දෙකම ආරම්භ කිරීම සඳහා මේ ගරු සභාවේ කරන ලද යෝජනාවක් අනුව ක්‍රියාත්මක වෙලා විශේෂයෙන්ම අපේ අදාළ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒවගේම අපේ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිළධාරීන් ඒවගේම අපේ ගරු අමාත්‍ය මණ්ඩලය මේ හැම කෙනෙක්ගේම සහයෝගය ඇතුව අද මේ සඳහා අපිට ප්‍රඥප්තියක් ඉදිරිපත් කරන්න බැ. අපිට විමධ්‍යගත වෙච්ච විෂයක් නෙමෙයි. ඒ නිසා ධවල පත්‍රිකාවක් අනුමත කර ගැනීම සඳහා අපි ඉදිරිපත් කරලා තියෙනවා. මේ කාරණාව දිගින් දිගටම ඇදී යද්දී මේ අවස්ථාව අපි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට මගේ අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් ලෙස මේ වගකීම පැවරුවා එතුමා මේ කාර්යය භාරය ඉතාමත් ඉහළින් සහ කඩිනමින් මේක කරා ළඟා වෙන්න අවශ්‍ය සහයෝගය ලබා දුන්නා කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරමින් මේ කාරණාව අනුමත කරලා දෙන්න මේ පළාත් සභා බලප්‍රදේශයටම බලපාන ආකාරයෙන් මෙය ස්ථානගත වෙන්නේ පරකඩුව, දැනට අපේ පුහුණු පාසැල ස්ථානය තියෙන ගොඩනැගිල්ලේ. ඒක අපේ දිස්ත්‍රික්ක දෙකටම මධ්‍යස්ථාන දෙක ලෙස තෝරා ගෙන තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් වරින් වර මේ සභාවේ ප්‍රශ්න නැඟුවා. ඒ ප්‍රශ්න අනුව අපි මේවාට පිළිතුරක් ලෙස මේ කාර්යය කඩිනමින් අදාළ නිළධාරීන්ගේ ඒ සඳහා තාක්ෂණ දැනුම ඇති නිළධාරීන් ගෙනල්ලා අපේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු නිළධාරීන් සමඟ සාකච්ඡා කරලා අපි මේ කටයුත්ත අද මේ තත්ත්වයට ගෙනල්ලා තියෙනවා. ඒ නිසා මේක ඉදිරිපත් කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ගරු ප්‍රධාන ඇමතිතුමා ගෙනාපු ප්‍රජා ගුවන්විදුලි සේවාව සම්බන්ධ යෝජනවා අපිට අපේ මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කරන්න කාලයක් අවශ්‍යතාවය තියෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලනවා අපිට වෙන දිනයක් සාකච්ඡාවට ඉඩ දෙන්න කියලා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි මෙතුමන්ලා කාලය ඉල්ලනවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න .

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

-------------------------------------------------------

ඒ ගැන මගේ ගරු සභාපතිතුමනි විරුද්ධත්වයක් නැ. මේක ඕන කෙනෙකුට විවෘතයි. ඕන කෙනෙකුට පුළුවන් මේ සම්බන්ධයෙන් කරුණු දැන ගන්න. ගරු සභාපතිතුමනි අපි මේ සම්බන්ධයෙන් මඩකලපුවට ගිහිල්ලා විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් ආචාර්ය ප්‍රදීප් වීරසිංහ මැතිතුමා අපේ සලිත කරුණාරත්න අපේ ගරු මන්ත්‍රීතුමාගේ මැදිහත්වීමත් සමඟ අපි ඒ සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් ගෙනල්ලා අපිව දැනුවත් කරලා

තියෙනවා. අපේ නවක මන්ත්‍රීවරු ඊට පස්සේ ඇවිල්ලා තියෙන්නේ ඒ මන්ත්‍රීවරුන්ටත් ඒ ගැන කරුණු පැහැදිලි කිරීමේ වගකීම විපක්ෂනායකතුමා ඇතුළු තමුන්නාන්සේලාට හොඳයි මේක මොකද ඉතා ඉක්මනින්ම කරන්න පුළුවන් තරමට ඒ නිළධාරීන්ගේත් උනන්දුවක් තියෙනවා ගරු සභාපතිතුමනි ගුවන්විදුලි සංස්ථාවේ ඉංජිනේරුවරයා ,රූපවාහිනී සංස්ථාවේ ඒවගේම මේ සම්බන්ධයෙන් අදාල තාක්ෂණ දැනුම තියෙන නිළධාරීන් සියල්ලම ගෙනල්ලා ගිය සතියේත් අපි සාකච්ඡාවක් පැවැත්වූවා පරකඩුවේ පුහුණු මධ්‍යස්ථානයේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ සම්බන්ධයෙන් තියෙන අවශ්‍යතාවය පැහැදිලි කිරීම නිසා තමයි අපි මේ කාර්යය ගෙනල්ලා ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒ නිසා අපි හුඟාක් දුරට ඌව පළාත් සභාවේ ධවල පත්‍රිකාවත් සමඟ සාකච්ඡා කළා. අපි ඔබතුමන්ලා සමඟ සාකච්ඡා කළා. වරින් වරට එක එක්කෙනා පැමිණුන පැමිණුන ගාණට සභාවේ කාලය තමුන්නාන්සේලා මිඩංගු කරනවා නම් ඒක මගේ විරුද්ධත්වයක් නෑ. වඩාත් දැන ගැනීම සඳහා කැමති දෙයක් කළාට කමක් නෑ. හැබැයි කාලය තමුන්නාන්සේලාගේ අතේ තියෙන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

විපක්ෂනායකතුමා කාලය අවශ්‍යයි කියලද කියන්නේ ඔබතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

-----------------------------------------------------

ඊළඟ සභා වාරයට ගන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------

සලිත මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි ,ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි සබරගමු ප්‍රජා ගුවන්විදුලි සහ රූපවාහිනි මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ධවල පත්‍රිකාව ඉදිරිපත් කිරීමම මේ සබරගමු පළාත් සභාවේ ඉතිහාසයේ ඓතිහාසික අවස්ථාවක් විදිහට මම සලකනවා. විශේෂයෙන් මේ ගුවන්විදුලිය සහ රූපවාහිනිය පිහිටුවන්නේ සබරගමුවේ ජනතාවගේ උන්නතිය වෙනුවෙන්. ඒ අපි දිගින් දිගටම සාකච්ඡා කළා. අප විසින් යෝජනා කරන අවස්ථාවේදීත් සිහිපත් කළා අධ්‍යාපනික, සාමාජීය, දේශපාලනීය,සංස්කෘතික වශයෙන් මහා නවෝදයක් මහා ඉදිරි පිම්මක් සබරගමුවට අපේක්ෂාවෙන් තමයි අපි මේ ගරු සභාවේ සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් ආවේ. ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් වසර ගණනාවක් තිස්සේ අයවැයෙන් මේ කාරණාව ඉෂ්ඨ කරනවා කියලා කියලා අද වෙන කොට ප්‍රායෝගික තැනට ඇවිල්ලා තියෙනවා. ඒ අනුව සාකච්ඡා වට ගණනාවක් කථිකාවත ගණනාවක් ඒ අනුව නිරීක්ෂණ ගණනාවක් මේ පිළිබඳව විශේෂඥ දැනුමක් තියෙන කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩලයේ ආචාර්ය ප්‍රදීප් වීරසිංහ මැතිතුමාගේ මඟ පෙන්වීම මේ සියල්ලක් එකතු කරගෙන තමයි මේ ධවල පත්‍රිකාව අද ඉදිරිපත් කරලා තියෙන්නේ. කෙනෙක් මේ පිළිබඳව සැකෙන් බලනවා නම් මේක දේශපාලන ප්‍රතිරූප හදන එකක් හරි වෙන

කාරණාවක් පිළිබඳව සැකෙන් බලනවා නම් මම ඒ කාරණාව තරයේ ප්‍රතික්ෂේප කරන්න කැමතියි ගරු සභාපතිතුමනි. ඉතා පැහැදිලිවම මේක ස්වාධීන ආයතනයක් බවට සපථ වෙන විදිහට කළමණාකාර මණ්ඩලය හඳුන්වාදීලා තියෙනවා. මේ ධවල පත්‍රිකාව අපි ගරු මන්ත්‍රීවරුන්ට ලබාදිය යුතු නිසා ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගත්තු තීන්දුව ක්‍රියාවට නන්වන්න ඊළඟ අවුරුද්දට තල්ලු කරන්නේ නැතුව මේ වර්ෂයේ ක්‍රියාවට නන්වනවා නම් මේ ධවල පත්‍රිකාව අනුමත කරලා දෙන්න කියන ඉල්ලීම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

විපක්ෂනායකතුමා ඔබතුමන්ලාට කාලය අවශ්‍යයි කියලාද කියන්නේ. ඔබතුමන්ලා සාකච්ඡා කරන්න සූදානම් නෑ. මේ පිළිබඳව. ඒක හරි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ධවල පත්‍රිකාව සභාගත කෙරුවා. ඒ පිළිබඳව තත්ත්වය ගරු සලිත කරුණාරත්න මැතිතුමා ඒකට මැදිහත් වෙච්ච කෙනෙක් හැටියට ඒ කරුණ පැහැදිලි කලා. ඔබතුමා ඉල්ලීමක් කරනවා මේකට කාලය අවශ්‍යයි කියලා. මම තවදුරටත් ඔබතුමන්ලාගෙන් අහන්නේ අද සාකච්ඡාවට ඔබතුමන්ලා කියන්නේ අද ගන්න අමාරුයි ඊළඟ තව දවසක් දෙන්න කියන එක. ඒකද ඔබතුමන්ලාගේ ඉල්ලීම විපක්ෂනායකතුමා

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*

---

ගරු සභාපතිතුමා අපි කණ්ඩායම් රැස්වීමේදී අපි සාකච්ඡා කළා මේකට අපිට කාලය මදි වුණා. කාලය මදි වුණ නිසා අපි කල්පනා කළා මේක කල් දාලා ඊළඟ සභා වාරයේදී සාකච්ඡා කරලා අනුමැතියක් දෙන්න අපේ එකඟතාවය එළ කරන්න කටයුතු කරනවා කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

හරි හොඳයි විපක්ෂනායකතුමා එහෙම නම් ඔබතුමන්ලා මේ පිළිබඳව තවදුරටත් කල් අවශ්‍යයි කියලා කියන නිසා අපි ඊළඟ සභා වාරයට මේ යෝජනාව සාකච්ඡා කිරීම සඳහා අපි ඉස්සරහට යවනවා.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා අංක 6/1/2015/14 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*

---

ගරු සභාපතිතුමනි රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන මැතිවරණ බලප්‍රදේශයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හඳගිරිය වසමේ පිහිටි ලූණුමැඩිල්ල හෙවත් ලූණුම්දැල්ල ඇල්ල උපයෝගී කරගෙන කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාරයක් පෞද්ගලික සමාගමක් විසින් ඉදි කිරීමට යෝජනා සහ අවශ්‍ය කටයුතු සකස් කරගෙන යන බව දැන ගැනීමට ඇත. මෙම භූමි භාගය අපගේ ප්‍රදේශයේ ඉතා වැදගත් පාරිසරික ඓතිහාසික මානව ශිෂ්ටාචාරයකට නෑකම් කියන පෞරාණික පුරාවෘත්ත රාශියකට මූල බීජය සපයන මනරම් පරිසරයක පිහිටි දිය

ඇල්ලක් බව ප්‍රකාශ කරන අතර, ඉහළ ජෛව විවිධත්වයක් ඇති මනා පරිසර පද්ධතියකින් යුත් මෙම ප්‍රදේශයේ පිහිටි මෙම රමණීය දිය ඇල්ල ආරක්ෂා කර ගැනීම වස් මෙම පෞද්ගලික සමාගම මඟින් ඉදි කිරීමට යෝජිත විදුලි බලාගාරයට විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර මින් ඉදිරියට කුමන ආකාරයක ඉදිකිරීමක් හෝ විදුලි බලාගාරයක් හෝ නොකළ යුතු යැයි මෙම පළාත් සභාව යෝජනා කරන්නීය.

ගරු සභාපතිතුමනි මෙම දිය ඇල්ල ඉතාම වැදගත් පාරිසරික පද්ධතියකට නෑකම් කියන දිය ඇල්ලක්. ප්‍රධාන වශයෙන් කියනවා නම්

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රශ්නය විදුලිබල අමාත්‍යවරයා ලෙස මටත් අදාළ ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය මම හිතනවා අපේ ගරු අජිත් මන්ත්‍රීතුමා මට අවස්ථාවක් දෙන්න මේ ස්ථානයත් පරීක්ෂා කරලා මමත් ඇවිල්ලා ඔබතුමාත් එක්ක ඊට පස්සේ සභාවට අපි වාර්තාවක් ඉදිරිපත් කරන එක හොඳයි කියන එකයි මගේ අදහස. මොකද මේක අපි සාකච්ඡා කළාට ඒ අමාත්‍යවරයා හැටියට ඒ ගැන කරුණු මම ප්‍රායෝගිකව දැක ගැනීමට ලැබෙන්නේත් නැහැ. ඒක නිසා මම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමාගෙන් ලබන සභා වාරයට පෙර ඒ සම්බන්ධයෙන් ගිහිල්ලා විමසීමක් කරලා මම ඊළඟ සභා වාරයට කරුණු රැගෙන එන්නට මේ යෝජනාව එන සභා වාරයට ගන්නවා නම් හොඳයි කියන එකයි මගේ අදහස. එතකෙට අපිට සුහදව මේ ප්‍රශ්නය ගැන කතා කරන්න පුළුවන්. දැන් අපි විවාදයක් විතරයි වෙන්නේ. ඒක මං හිතන්නේ ඔබතුමාගේ බලාපොරොත්තුවක්වත් අපි කාගේවත් බලාපොරොත්තුවක්වත් නෙමෙයි. මේක තර්ක විතර්ක ඉදිරිපත් කරලා විතරක් නෙමෙයි අපි මේක සුදුසු දෙයක් මේ කාරණා ගැන මගේ අදහස මෙපමණයි ගරු සභාපතිතුමනි. ලබන සභා වාරයට ඔබතුමාත් කරුණු ඉදිරිපත් කරන්න එතකොට එහි තිබෙන යතාර්ථභාවය මමත් කරුණු ඉදිරිපත් කරන්නම්.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි ඇත්තටම මමත් මේ යෝජනාව අවසානයේ ඉල්ලීමක් කරන්න තමයි කරුණු ඉදිරිපත් කරන්න තමයි සූදානම් වුණේ. මේ පිළිබඳව පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු ප්‍රධාන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ ප්‍රදේශය නිරීක්ෂණය කරලා මේ කඳු ළහැඹ ඔබතුමාට තරණය කරන්න පුළුවන්ද කියන එක ලොකු ගැටළුවක් . මොකද ඒ තරම් දුෂ්කර තැනක් එතන. ගිහිල්ලා නිරීක්ෂණය කරලා මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාවගේ තියෙන මතය මොකද මේ කාල පරිච්ඡේදය තුළ ගරු ප්‍රධාන ඇමතිතුමනි ප්‍රදේශයේ ජනතාවගේ මතය වෙනස් කිරීම සඳහා වරදාන වරප්‍රසාද ඔවුන්ට ප්‍රදානය කරමින් යන කාල පරිච්ඡේදයක්. ඒ නිසා ඉතා ඉක්මනින් එතනට ගිහිල්ලා නිරීක්ෂණයක් කරලා නිරීක්ෂණ වාර්තාවක් ගන්න එක සුදුසුයි කියන යෝජනා කරන්න තමයි ඔබතුමාට ලෑස්ති කරන්න හිටියේ. යෝජනාවට අවශ්‍ය කරුණු මේකට අවසර පත්‍ර ලබාගන්නා ක්‍රමවේදය පිළිබඳව සැහෙන ගැටළුසහගත තත්ත්වයක් තියෙනවා. මැණුම් නියෝග ලබාගැනීමේ ගැටළුසහගත තත්ත්ව තියෙනවා. මේ පිළිබඳව දැනුවත් කරන්න තමයි විශේෂයෙන් අද මේ යෝජනාව ඉදිරිපත් කළේ. එතෙක් ඔබතුමාට කියන්නේ මට ඊයේ රාත්‍රියේ ආරංචි වුණේ මේ ප්‍රදේශයේ අවශ්‍ය කරන රැහැන් මාර්ගයක් සකස් කරන්න කටයුතු කරගෙන යනවා කියලා. කොන්ත්‍රාත් එකක් දීලා කියලා. එසේ නම් ඔබතුමා ඒ නිරීක්ෂණ චාරිකාව

කරලා මේ පිළිබඳ වාර්තාව සකස් කරන තුරු අද ඉඳලා ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට දැනුම් දෙන්න බලංගොඩටත් වැලිගෙපොලටත් මොකද මෙතන වැලිගෙපොල විතරයි මූලික කරගෙන තොරතුරු අරන් තියෙන්නේ. මේ කොටසේ බැම්ම ඉදි වෙන්නේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ. කරුණාකර ඔබතුමා දැනුම් දෙන්න යම්කිසි හෝ ඉදිකිරීමක් කරනවා නම් එය වහාම නතර කරන්න කියලා ඔබතුමාගේ වාර්තාව මේ නිරීක්ෂණයෙන් පස්සේ ලබාදෙන තුරු.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

-----------------------------------------------------

මේ කරුණු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමනි එන සභා වාරය දක්වා මට කාලය ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එතුමා කියපු කරුණුත් සලකලා බලලා මෙහි තියෙන කරුණු අනුව මම තීන්දුවක් අරගෙන ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්නම්.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------

ඊයේ,හෙට,අද වගේ ඉදිකිරීම් කරනවා කියලා මට දැන ගන්න ලැබුණා. ඒ දේ ඒ ඉදිකිරීම් නතර කරන්න මොනවා හරි කටයුත්තක් කරන්න පුළුවන්ද?

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*

-----------------------------------------------------

මට ගරු සභාපතිතුමනි එහෙම සෘජු තීරණ ගන්න බැහැ. මොකද මේ කරුණු එකක්වත් පළාත් සභාවලට අයිති නැහැ. අපෙන් අහන්නේත් නෑ. නමුත් අපිට යම් සාධාරණ ඉල්ලීමක් මධ්‍යම රජයේ විදුලිබල අමාත්‍යතුමාගෙන් ඉල්ලීම් කරන්නවත් මම කරුණු දැන ගන්න ඕනේ. ඒ නිසා මේවා ඉහළින් අනුමත කරගෙන ඇවිල්ලා මේ දිස්ත්‍රික්ක දෙකේම විදුලිබල යෝජනා සිය ගණනක් අද එහෙම කතා කළහම පරිසරය විනාශ වෙලා තියෙනවා. ඒ නිසා ඒ කරුණු නතර කිරීමේ අයිතියක් මට නෑ. නමුත් මට දැනුම් දෙන්න පුළුවන්. මට නැති බලයක් මගේ අතට ගන්න මම කැමති වෙන්නේ නෑ. මගේ පළාත් සභාවේ. නමුත් ඒ කාරණාව ජනතාවගේ අවශ්‍යතාවය අනුව තීන්දු කළ යුතු නිසා තමයි මම ගරු සභාවෙන් ඉල්ලුවේ මට එන සභාව තෙක් දෙන්න මේ මගේ අයිතිය තුළ ක්‍රියාත්මක වෙන්න. මට වෙනත් දේවල් තහනම් කරනවා කියලා පොරොන්දු වෙන්න බෑ ගරු සභාපතිතුමනි. ඒක මට අයිති දෙයක් නෙමෙයි.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------

දැන් විදුලිබලාගාරය ඉදිකිරීම මධ්‍යම ආණ්ඩුව සතුයි කියලා කිව්වට දැන් සංචාරක පුරවරයක් වශයෙන් අපේ සංචාරක ඇමතිතුමා ඒ ප්‍රදේශයේ විශාල වැඩ කටයුත්තක් ආරම්භ කරලා තියෙනවා. ඒ කාරණාවේදී මේ සංචාරක පාරාදීසියක් වගේ මෙච්චර කල් ඇස ගැටිච්චි නැති දැන් ඊයේ පෙරේදා ඔබතුමාට රූපවාහිනිය බැලුවා නම් රාජ්දේව කියන මහාචාර්ය තුමා ඉළුල්කුඹුර ප්‍රදේශයේ ගල්ලෙනක තිබිච්චි ඒ පුරා වස්තුත් එක්ක බැලුවහම අපි කවුරුවත් ඉන්දියාවෙන් හාල් ගෙනල්ලා කාපු උදවිය විදිහට තමයි ඉතිහාසයේ තියෙන්නේ. ඉන්දියාවෙන් තමයි අපිට බත දීලා තියෙන්නේ කියලා කියන්නේ. හැබැයි අවුරුදු හයදාස් පන්සියකට එහා ඉඳලා අපේ රටේ මිනිස්සු බලංගොඩ මානවයාගේ ඉඳලා

පැවතිච්චි මිනිස්සු ධාන්‍ය වර්ග පාවිච්චි කරලා තියෙනවා කියලා සාක්ෂි ලැබිලා තියෙනවා. මෙය ඉතාමත් වැදගත් පාරිසරික පද්ධතියක් මේක අපේ පළාත තුළ පිහිටිලා තිබෙන ඉතාම වැදගත් දෙයක්. ඒ නිසා මම යෝජනා කරනවා නෙමෙයි. යෝජනාවේ කරුණු මොකුත් කියන්නේ නෑ. ඒක අපිට අයිතියක් තියෙනවා කියන එක මේ අවස්ථාවේදී පැහැදිලි කරන්නේ.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*
-----------------------------------------------------------

මෙතුමා ඉල්ලුවා එන සභාව තෙක් මේ ධවල පත්‍රිකාවට කාලයක් දෙන්න කියලා. මම මේ ගරු සභාවෙන් ඉල්ලන්නේ එන සභාව තෙක් කල් ඉල්ලන්නේ. මෙතුමා කරුණු පැහැදිලි කළාම ඒක මේ සභා රීතියට විරුද්ධයි. අපි එකඟතාවයෙන් ඉන්නවා නම් එහෙම කරමු. මම මේ ඉල්ලීමක් කළානේ. එතකොට ඔබතුමා ඒ ගැන කල්පනා කරන්න. ගරු විපක්ෂනායකතුමාගේ ඉල්ලීම මම සැලකුවානේ.

මම එකඟයි.

***ගරු ප්‍රධාන අමාත්‍ය** මහීපාල හේරත්*
***கௌரவ பிரதான அமைச்சர் மஹிபால ஹேரத்***
*Hon. Chief Minister Mahipala Herath*
-----------------------------------------------------------

එකඟ නම් මෙතන කතා කරන්න අවශ්‍ය නෑ කාලය නාස්ති වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

හරි ඔබතුමා එකඟයිනේ ඒ කාරණාවට. ලබන සභා වාරයට එතුමා වාර්තාව ඉදිරිපත් කරන්නම් කිව්වානේ. ඒකේ ගැටළුවක් නෑනේ ඔබතුමාට. හොඳයි.

මීළඟට එතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉල්ලීම අනුව ඊළඟ සභා වාරය තුළදී සාකච්ඡා කිරීමට අපි සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා.

මීළඟට ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2015/11 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ පිළිබඳව ඉදිරිපත් කිරීමේදී අපේ අධ්‍යාපන අමාත්‍යතුමා හිටියා නම් තමයි වැදගත් වෙන්නේ. මේක මට පමණක් නොවෙයි. මගේ යෝජනාවට පමණක් නෙමෙයි. සමස්ත සියළුම ප්‍රදේශයටම බලපාන යෝජනාවක් මේ යෝජනාව. බෝධිමළුව විද්‍යාලය මේ වනවිට ප්‍රාථමික පාසැලක් විදිහට සංවර්ධනය වෙන අතර , මේක 2014 වර්ෂයේ තිබ්බේ ද්විතීක පාසැලක් විදිහට. අ.පො.ස.(සා/පෙළ) දක්වා තිබූ පාසැලකි. ප්‍රදේශයේ පිහිටීම අනුව මෙම විද්‍යාලය ප්‍රථමික පාසැලක් නොකර පෙර තිබූ පරිදි අ.පො.ස.(සා/පෙළ) දක්වා ඉගෙනුම ලබන පාසැලක් බවට නැවත පත් කරන ලෙස තමයි මම යෝජනාව සභාගත කළේ ගරු සභාපතිතුමනි. මම මේක ඉල්ලා සිටිනවා අනුමත කර දෙන්න කියලා. විශේෂයෙන්ම අර පසුගිය පාසැල් කළමණාකරණ කිරීම තුළදී පිහිටීම

භූවිෂමතාව පිහිටීම අනුව මෙම ප්‍රාථමික විද්‍යාලයක් බවට බෝධිමළුව පත් කළහම ඒකේ ද්විතීක පාසැල තියෙන්නේ එකක් තියෙන්නේ පොහොරබාව ප්‍රදේශයේ. ඒකට කිලෝමීටර් තුනක් විතර යන්න ඕනේ. ඒවගේම නාරඳ විද්‍යාලය තියෙනවා ඒකට කිලෝමීටර් තුනක් විතර යන්න ඕනේ. ඊළඟට අමුහේන්කන්ද විද්‍යාලය තියෙනවා ඒකට කිලෝමීටර් එක හමාරක් විතර යන්න ඕනේ. ඒ නිසා මේකේ නොයෙකුත් ප්‍රදේශවල ගම්වල ඉන්න දරුවන්ට ඒ දෙමව්පියන්ට ද්විතීක පාසැලට යන්න තියෙන දුෂ්කරතාවය නිසා තමයි මේ පාසැල ප්‍රාථමික පාසැල් නොකර ද්විතීක පාසැලක් නැවත සංවර්ධනය කරන්න කියන යෝජනාව ඉදිරිපත් කළේ. මේ පිළිබඳව දිගින් දිගටම ඉල්ලීම් කළා ගරු සභාපතිතුමනි නමුත් අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහ අධ්‍යාපන ලේකම්තුමාගේ එකඟතාවයක් මේ සඳහා ලබා දුන්නේ නෑ. ඒ නිසා තමයි මේක ස්වභාවික ගෙන එන මට්ටමට ඇති වුණේ. මේ පාසැල වගේම තවත් පාසැල් ගණනාවක් ඇහැලියගොඩ ආසනය ඇතුළත්ව මේ රත්නපුර දිස්ත්‍රික්කය පුරාම මේ භූවිෂමතා පිහිටීම අනුව ඒ කළමණාකරනය කළ යුතු ක්‍රමවේදය අනුව යම් යම් ගැටළුසහගත තිබ්බිච් තැන් තිබුණා. ඒ නිසා මම යෝජනා කරන්නේ ගරු සභාපතිතුමනී අධ්‍යාපන අමාත්‍යතුමාත් අධ්‍යාපන ලේකම්තුමාත් එකට එකතු කරලා අපේ මේ පළාත් සභාවේ තවත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ එවැනි ප්‍රශ්න සහ අලුත් යෝජනා අලුත් සංශෝධන දේවල් සියල්ලක්ම අරගෙන එක්කෝ කාරක සභාවක් පත් කරලා අපිට සාකච්ඡා කරලා තීන්දු ගන්න සාකච්ඡා කරලා හෝ එහෙම නැත්නම් කමිටුවක් පත් කරලා කමිටුව මගින් නිර්දේශ අරගෙන මේ පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් තමයි ගරු සභාපතිතුමනි මම යෝජනා කළේ. ඒක නිසා මේක සභාවේ අනුමත කරලා දෙන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

නමින්ද මන්ත්‍රීතුමා ඔබතුමාට ස්තූතියි.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

-------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මෙම යෝජනාවට සංශෝධන කීපයකුත් ඉදිරිපත් කරනවා. එතුමා කිව්වා වගේ බෝධිමළුව පාසැල වගේම ප්‍රධාන පාසැල් ගණනාවක් තව තියෙනවා. ඒවායේත් විධිමත්භාවයකින් කටයුතු කිරීම ඇරඹිය යුතු අතර, මෙම සංශෝධනත් ඇතුළත් කරනවා. මීට වසර කීපයකට උඩදී ජනප්‍රිය පාසැල්වල තිබුණ පංති සංඛ්‍යාව අඩු වෙලා තියෙනවා. මේ නිසා ආසන්නම තියෙන ජනප්‍රිය පාසැලක දරුවෙකු ඇතුළත් කිරීමට නොහැකියාවක් ඇති වෙලා තියෙනවා දෙමව්පියන්ට. ඒ අනුව ඒ නිසාම විශේෂයෙන්ම ඇහැලියගොඩ ප්‍රාථමික විද්‍යාලය වැනි පාසැල්වල තවත් පංති එකක් හෝ දෙකක් වැඩි කිරීමට කටයුතු කරන්නට කියලා මෙම යෝජනාව සමඟ මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

-------------------------------------------------------

ගරු සභාපතිතුමනි මම ඔබතුමාට ඉල්ලීමක් කරනවා. මේ පළාත් සභාවට මහජන නියෝජිතවරු හැටියට අපි යෝජනාවල් ගේනවා. මේ යෝජනාවල් විවිධ විවිධ අමාත්‍යාංශවලට සම්බන්ධ යෝජනාවල්. අද අධ්‍යාපන යෝජනාවක් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිම කෙනෙක් මේ සභාවේ නෑ. ලේකම්වරයෙක් හෝ සහකාර ලේකම්වරයෙක් හෝ නිළධාරියෙක් කිසිම කෙනෙක් නෑ. ඒ නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා මේ යෝජනාවලට අදාල විෂය භාර

අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නම් අමාත්‍යාංශවලට කැඳවීමක් කරන්න කියලා සභා වාරවලට. පැහැදිලිවම. නැතුව මේවා කතා කරලා වැඩක් නෑ. අපි මේවා කතා කරලා තේ බීලා ගෙදර යනවා. සිද්ධ වෙන්නේ ආයේ ඊළඟ වාරයකටත් කතා කරන්න. මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු අමාත්‍යතුමනී. එතුමා හොඳ කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළේ. මින් ඉදිරියට ඒ ආකාරයට කටයුතු කිරීමට වගබලා ගන්නා බව ප්‍රකාශ කරනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද බෝධිමළුව විතරක් නෙමෙයි සභාපතිතුමනි, පාසල් පද්ධති කීපයකම මේ ගැටළුව පවතිනවා. ඒ එක්කම ගරු සභාපතිතුමනි, විශාල අසාධාරණයකට ලක් වෙනවා, මම දන්නවා ප්‍රාථමික පාසල්වලින් අධ්‍යාපනය ලබලා ඊළඟට ඉහළ 6 වසරට යනකොට 5 වසරෙන් පස්සේ ඔවුන් ලකුණු අහනකොට අහන්නේ ශිෂ්‍යත්වයෙන් ලකුණු කීයද ? වැඩි බහුතරයකට පාසල් නෑ. මේ රත්නපුර නගරයෙත් එහෙම තියනවා. ප්‍රධාන පෙළේ තව ලොකු ගැටළුවක් මතුවෙලා තියනවා සභාපතිතුමනි, ජාතික පාසල්වල ඉගනුම ලබන පිරිමි ළමුන් ෆර්ගියුෂන් උසස් බාලිකා විද්‍යාලය, ඊළඟට ජේසු බිළින්දාගේ කන්‍යාරාම විද්‍යාලය,මේ වගේ විශාල ලෙස මේ ප්‍රශ්නය අපට දැඩි ලෙස මතුවෙලා තියනවා. දැන් ළමයින්ට පාසල් නැති තත්ත්වයක් උදාවෙලා තියනවා. 6 වසරට යන්න බැරි තත්ත්වයක් දැන් උදාවෙලා තියනවා. අහපු ගමන් අහන්නේ ඒ අදාළ විදුහල්පතිවරු ශිෂ්‍යත්වයේ ළකුණු කීයද ? නමුත් ශිෂ්‍යත්වය ළකුණු ගත්තාම ඒ යන්න ඕන ඉලක්කගත තත්ත්වයට යන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියනවා. මේ නිසා විශාල ගැටළු මතුවෙනවා. නමුත් මේවාගේ පාසල්වලත් අපට ඒ පන්ති අහිමි කළොත්, ප්‍රාථමික පාසල් බවට පරිවර්තනය කළොත් ඒ ප්‍රදේශයේ දරුවන්ට අධ්‍යාපනය ලබන්න තිබෙන අවකාශ අඩුයි. ඒ වගේම ඒ ප්‍රදේශයේ ළමයින්ට වෙනත් දුෂ්කර පාසල්වලට යන්න වෙලා තියනවා. දැන් අපි ගත්තාම හිග්ගස්වත්ත කණිෂ්ඨ විද්‍යාලය. ඊට පස්සේ වෙනත් පාසලක් ලබාගත්තොත් හොඳයි. මධ්‍යම මහා විද්‍යාලය. එහෙම නැති වුනොත් ඒ දරුවන්ට යන්න පාසලක් නෑ. ඒ නිසා මේ පිළිබඳව අපි විශේෂ අවධානය යොමු කරන්න ඕන. ඒ එක්කම රංජිත් බණ්ඩාර ඇමතිතුමා කිව්ව විදිහට මේක න්‍යාය පත්‍රයට ඇතුළත් වෙනකොට ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ ස්ථානයේ රැඳී සිටිය යුතුයි. අනෙක් පැත්තෙන් ගරු සභාපතිතුමනි, අදාළ නිළධාරින් කැඳවලා අපි කථා කරන ඒවා මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයට දැනුවත් කරලා, ඒ වගේම අපේ අමාත්‍යාංශයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා, කලාප අධ්‍යක්ෂතුමන්ලා දැනුවත් කරලා මේක විධිමත්ව ඉදිරියට ගෙනියන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් අපි අනුගමනය කරන්න ඕන. මොකද මේක තමයි අනාගතය භාරගන්න ඉන්න අපේ දරුවන්ට දෙන අධ්‍යාපනය. එහෙම නම් අපි අධ්‍යාපනයෙන් ඉහළ මට්ටමට එනකොට, මොකද මට තේරෙන්නේ නැත්තේ මොකද, අපේ පළාත දිනෙන් දින අධ්‍යාපනයෙන් ඉහළට එනකොට පහළ මට්ටමෙන් අපි පල්ලෙහාට වට්ටන්න උපක්‍රමයක් යොදනවාදෝ කියන සැකයක් අපට මතු වෙනවා. මොකද අපි එක පැත්තකින් ආඩම්බර වෙනවා සබරගමුවේ අධ්‍යාපනය එක පැත්තකින් දරුවෝ ආඩම්බරයෙන් කථා කරන්න පුළුවන් අවස්ථාවකට එනකොට අනෙක් පැත්තෙන් අපි උපක්‍රමශීලීව මේක බිමට වට්ටන්න යම් ක්‍රියා මාර්ගයක් යොදනවාදෝ කියන සැකයක් තියනවා. ඒ නිසා අපි ඒක අඛණ්ඩව පවත්වාගෙන

යන්න ඕන. ඒ වගේම අපේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නංවන්න ඕන. ඒ වගේම පාසල්වල විශාල අඩුපාඩුවක් තියනවා. මම දැන් දකිනවා හෙට අනිද්දා අපේ ප්‍රධාන ඇමතිතුමාට සහ අපේ මැති ඇමතිවරුන්ට එන්න පුළුවන්. මොකද පාසල්වල පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු කිරීම නිසා 35, 40 දක්වා අඩු කිරීම තුළ පහුගිය කාලයේ 45, 50 ගත්ත පාසල්වල මේ වෙනකොට විශාල ඉල්ලුමක් තියනවා. තරඟකාරීත්වයක් තියනවා නගරබද පාසල්වල. මේකට දැන් වැඩ

පිළිවෙලක් නෑ. ඒ එක්කම මම ප්‍රධාන ඇමතිතුමා සහ අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනවා යම් හෙයකින් අපේ ඉල්ලීමක් වුනොත් පාසල් පද්ධතියේ තවත් පන්ති කාමරයක් වැඩි කරන්න. මොකද එහෙම නැති වුනොත් නගර බද පෝෂිත බල ප්‍රදේශය තුළ විශාල ළමුන් සංඛ්‍යාවකට පාසල් නෑ. මම දන්නවා ගරු සභාපතිතුමනි, නගරබද ගත්තාම මටත්, අපේ රංජිත් බණ්ඩාර ඇමතිතුමාටත් හොඳටම අත්දැකීම් තියනවා. මොකද නගරයේ, මොකද බහුතරයකට ඔප්පු නෑ ඉඩම්වල. ඒ අයගේ ඔප්පු නැතිවීම නිසාම ලකුණු 10 ක් අඩු වෙනවා. එතකොට ඒකට සූදානම් වෙච්ච දරුවන්ට පාසලට ඇතුළත් කිරීමේ අවස්ථාව වැඩිවෙලා තියනවා. ඒ නිසා නගරබද පාසල අවට පදිංචිකරුවාටම දැක දැකත් ඒ පාසල අහිමි වෙලා තියනවා.

ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ප්‍රධාන ඇමතිතුමා, අමාත්‍ය මණ්ඩලය, අධ්‍යාපන ඇමතිතුමා විශේෂයෙන්ම මේ පිළිබඳව මේක තෝරා බේරාගෙන මේ දරුවන්ට පාසල් ලබාදීමේ වැඩ පිළිවෙලක් ලකුණු මට්ටම කොහොම වුනත් පෝෂණ ප්‍රදේශය තුළ හිමිකමක් තියන සියළු ළමුන් ඇතුළත් කිරීමේ වැඩ සටහනක් සඳහා අපි ක්‍රියා මාර්ගයක් ගතයුතුයි. පාසල අවට ඔහුට සුදුසුකම් තියනවා නම් ලකුණු මට්ටම කෙසේ හෝ එකක් දෙකක් අඩු වුනත් මේ පාසල් පද්ධති තුළ ඇතුළත් කිරීමට සහ ඔවුන්ට අධ්‍යාපනය ලබාදීමේ බැඳීම සබරගමුව පළාත් සභාව බැඳී සිටිනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ යෝජනාවත් එක්ක, ඒ සංශෝධනත් එක්ක මේවා රැකගෙන මේ පාසල් පද්ධතිය තුළ අපේ දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සළස්වන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------
-

ස්තුතියි ! ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට ගරු රත්නායක මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

-------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඇත්තටම කාලෝචිත යෝජනාවක්. මේක ඔබතුමාත් මගේ හිතේ දන්නවා ඇහැළියගොඩ මැතිවරණ කොට්ඨාශය පිළිබඳව. මේ වගේ ගොඩාක් පාසල් තියනවා. ඒ වගේම උඩුවක සිද්ධාර්ථ විද්‍යාලයේ ද්විතීක පාසලක් තිබිලත් නැවත වරක් ඒකට අවසරය දුන්නා 1 වසර ආරම්භ කරන්න. ඉතින් ගරු සභාපතිතුමනි, මේක දිගින් දිගටම කථා කරන ප්‍රශ්නයක්. මම ප්‍රධාන ඇමතිතුමාත් එක්ක පෞද්ගලිකවත් කථා කළා. රංජිත් බණ්ඩාර ඇමතිතුමා කිව්වා, අද මේකට හැබැයි ඔබතුමා සභාපතිවරයා හැටියට, ප්‍රධාන ඇමතිතුමා හැටියට සහ අනෙක් අමාත්‍යවරු මෙතන ඉන්නවා. හැබැයි විෂයය භාර ඇමතිතුමා මෙතන නෑ. ඉතින් මේක අර රංජිත් බණ්ඩාර ගරු

ඇමතිතුමා කිව්වා වගේ මේක කිව්වාට වැඩක් නැති කාරණාවක් හැටියට තමයි පේන්නේ. හැබැයි ප්‍රධාන ඇමතිතුමා හැටියට එතුමාගේ විශ්වාසය තියලා තමයි අපි කථා කරන්නේ. එදත් කථා කළේ ඒ විදිහට. එදා අධ්‍යාපන ඇමතිවරයා හැටියට මහීපාල හේරත් ප්‍රධාන ඇමතිතුමාට සුදුහුණු ගානවා නෙමෙයි.

එතුමාට මොනවා හරි යමක් මේ සභාවේ දී කිව්වාම ඒකෙදී නිවැරදි තීන්දු ගත්තා. මම විෂයය භාර භාණු මුණිප්‍රිය ඇමතිතුමාට දෝෂාරෝපණයක් කරනවා නෙමෙයි. එදා අයවැය වෙලාවේ දීත් මම කිව්වේ මේක බොහොම සානුකම්පිතව බලලා, මොකද අධ්‍යාපනය සහ සෞඛ්‍යය කියන්නේ අපට ප්‍රධාන වශයෙන් බලපාන දෙකක්. ඒ නිසා එදත් මම කිව්වේ මේකට ඇහුම්කන් දීමක් කරන්න කියලා. මෙතනදී ඇත්තටම ඇහුම්කන් දීමක් නෑ. එතකොට අර මෙතුමා කිව්වා ජාතික පාසල් පද්ධතිය පිළිබඳව. ඔබතුමා දන්නවා ඇහැළියගොඩ ජාතික පාසල පිළිබඳව. මම හිතන්නේ අපේ සලිත කරුණාරත්න මැතිතුමා මේ සභාවේ කථා කළා. ජාතික පාසල අවට පෝෂිත කලාපයක් හැටියට ශිෂ්‍යත්වය පාස් මට්ටම 158 නම් ඒ පෝෂිත කලාපය තුළ දරුවෝ ටික ගන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ සභාව තුළ කළා. හැබැයි මේ වෙනකලුත් සිද්ධ වෙන්නේ රුවන්වැල්ල වෙන්න පුළුවන්, දැරණියගල වෙන්න පුළුවන්, බුලත්කොහුපිටිය වෙන්න පුළුවන්, නැත්නම් කළුඅග්ගල වෙන්න පුළුවන්, හංවැල්ල වෙන්න පුළුවන් මේ ලකුණු මට්ටම් තුළ දරුවෝ තමයි ඇහැළියගොඩ ජාතික පාසලට අදත් එන්නේ. ඇහැළියගොඩ පෝෂිත කලාපයක් හැටියට නම් දරුවෝ ඉන්නේ අල්පයයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, සියළුම දරුවෝ ඉන්නේ පොහොසත් උදවියගේ දරුවෝ නෙමෙයි. අහිංසක දුගී දුප්පත් උදවියගේ දරුවෝ ඉන්නවා. මම මීට ඉස්සෙල්ලත් මේ සභාවේ කිව්වේ ඒකයි. ඇහැළියගොඩ ජාතික පාසල දැක දැක රුවන්වැල්ලේ ජාතික පාසලට යනවා අහිංසක දුගී දුප්පත් මාළු විකුණන මනුස්සයාගේ දරුවා. මේ පිළිබඳව ගරු සභාපතිතුමනි, මේ සභාව තුළ දිගින් දිගටම කථා කළත් උත්තරයක් නැති නිසා මම හිතන්නේ සලිත කරුණාරත්න මැතිතුමා දැන් අවුරුදු තුන හතරකට ඉස්සෙල්ලා මේ පිළිබඳව කථා කළා. අපි කථා කළා. මේකට හැබැයි කථා කරනවා

විතරයි. කිසිම විසඳුමක් නෑ ගරු සභාපතිතුමනි. මම අද තේ බොනකොට අපේ ප්‍රධාන ඇමතිතුමාත් එක්ක කථා කලේ දිගින් දිගටම මේ සභාව තුළ අයවැය ඉදිරිපත් කරපු මොහොතේ සිට ඉල්ලීමක් කළා, ඊට පෙරත් මම මේ සභාවට එන්න ඉස්සෙල්ලා ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා හරහා මේ සභාවට යෝජනාවක් දැම්මා. මේකේදී ඇරැපොල මහින්ද විද්‍යාලයේ ප්‍රාථමිකය ආරම්භ කරන්න කියලා ඉල්ලීමක් කළා. කොච්චර පෙන්නුවත් වැඩක් නැති තත්ත්වයක් උදාවෙලා තියනවා. එදා අයවැය දවසේ දී විෂයය භාර ගරු ඇමතිතුමා කිව්වා බොහොම පැහැදිලිව දවස් 10 කින් ඇරැපොල මහින්ද විද්‍යාලයේ ප්‍රාථමිකය පටන් ගන්න දෙනවා කියලා. ඊට පස්සේ එතුමාට මම දුරකථන ඇමතුමකින් කථා කළාට පස්සේ කිව්වා ඔන්න රත්නායක 4 වෙනිදා, 5 වෙනිදා වෙනකොට මේක පටන් ගත්තහැකි. අපි උත්සවයක් තියලා මේක පටන් ගනිමු. මම කිව්වා ඔබතුමාත්, ප්‍රධාන ඇමතිතුමාත් ගෙන්වලා උත්සවයක් තියලා තමයි මේක පටන් ගන්නේ කියලා. අද 12 වෙනිදා. 14 වෙනිදා දරුවෝ පාසලට ඇතුළත් කරගන්නවා. අද වෙනකල් නෑ. මේක ඉසුරුපායට යන්න ඕන නෑ. එහෙම නම් පළාත් සභාවක් අපට වැඩක් නෑ. එහෙම නම් පළාත් සභාව තුළ අධ්‍යාපනය සඳහා පාසල් වැඩක් නෑ. එහෙම නම් මොකක්ද මේ කාරණය කියන බරපතල ප්‍රශ්නයක් තියනවා.

ගරු සභාපතිතුමනි, දේශපාලනය එපා වෙලා තියෙන්නේ. මහජන නියෝජිතයෙක් හැටියට අද ගමට යන්න බෑ. මම ප්‍රධාන ඇමතිතුමාට කිව්වේ දේශපාලනයෙන් සමුගන්නවා නම් මීට වැඩිය හොඳයි කියලා. හොරකම්

කරන්න, දූෂණ කරන්න, අල්ලස් ගන්න නෙමෙයි අපි කථා කරන්නේ. එදා හැබැයි අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කියනවා මගේ කට කැවත් මම කියනවා. ඇත්ත කථා

කරන්න ඕන. අන්න ලියුමකින් කියනවා කිහිප දෙනෙකුගේ උවමනාවට මේ 1 වසර ආරම්භ කරන්න කියලා එතුමා පැහැදිලිව කොහාටද දන්වන්නේ ඉසුරුපායේ ලේකම්වරයාට. මම යනවා සිකුරාදා මේ ලියුම අරගෙන. ගිහිල්ලා මම අහනවා අතිරේක ලේකම්, විජේරත්න මහතාගෙන්, ලේකම්තුමා මේ ලියුම ආවාද ? නෑ. අද අපේ ලේකම්තුමා කියනවා ඒක බොරුවක්. එහෙම නම් එදා ඒ මම කථා කරලා හවස් වෙනකොට ඉසුරුපායෙන් අනෙක් ලියුම ගෙන්වා ගන්න පුළුවන් නම් 14 වෙනිදා පාසල්වල 1 වසර පටන් ගන්න තියෙද්දීත් ළමයි පනස් ගාණක් ඇරැපොල ශ්‍රී මහින්ද විද්‍යාලයේ පෝෂිත කලාපය ලෙස ඇරැපොල, නැදුරන අඩුම ගානේ 40 ගන්නවත් පටන් ගන්න තිබුනේ දැන් දවස් කීපයකට ඉස්සෙල්ලා. හිදුරන්ගල ගත්තාම ඒ පාසලේ යුනිෆෝම් එකේ කලිසම නිල් පාට. ඇරැපොල පාසලේ කලිසම සුදු. එතකොට මේ දෙමව්පියන්ට කරන අසාධාරණය මොකක්ද ? කෝටිපතියන්ගේ දරුවෝ නෙමෙයි ඔය පාසල්වලට යන්නේ. දළු කඩන, කිරි කපන අහිංසක දෙමව්පියන්ගේ දරුවෝ යන්නේ. එහෙම නම් අද අපට ඡන්දය දීලා, මනාප දීලා මේ සභාවට එවන්නේ නිකම් මේ දෙන දීමනාවයි, තියන ටික කන්නයි, කාලා යන්නද ? ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමනි, මගේ අම්මපා මම කියනවා නම් දේශපාලනයෙන් සමුගන්න තත්ත්වයට ඇවිල්ලා. ගමට යන්න විදිහක් නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ප්‍රධාන ඇමතිතුමාගෙන් නැවත ඉල්ලීමක් කරන්නේ මේ 14 වෙනිදාට කෙසේ වෙතත් ඊළඟ සඳුදාවත් පටන් ගන්න කටයුතු කරන්න. මොකද මෙතුමා ගැන තමයි දැන් විශ්වාසය තියන්න පුළුවන් කම තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක ඔබතුමාත් දන්නවා. කරුණාපාල ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාත් දන්නවා. නමින්ද මන්ත්‍රීතුමාත් දන්නවා.

දේශපාලන අධිකාරිය හැටියට අපේ නිමල් විජේනායක මන්ත්‍රීතුමා, සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා එහෙම ඉන්නවා මේ මැතිවරණ කොට්ඨාශය තුළ. 7 දෙනෙක් ඉන්නවා ඇහැළියගොඩ මැතිවරණ කොට්ඨාශය තුළ පළාත් සභාව නියෝජනය කරන. පළාත් සභාවේ 7 දෙනෙක් මහජන නියෝජිතයෝ ඉඳලා මේක ක්‍රියාත්මක කරන්න බෑ. මම දන්නෙ නෑ. නිහඬ පිළිවෙලත් අනුගමනය කරන්න එපා ඇහැළියගොඩ නියෝජනය කරන මන්ත්‍රීවරු. මේකට කථා කරන්න. නමින්ද මන්ත්‍රීතුමා මේ යෝජනාව දැම්මාම අපටත් කැක්කුමක් තියනවා මේ ඇරැපොල විතරක් නෙමෙයි. බෝධිමළුව විතරක් නෙමෙයි. මෙහෙම පාසල් ටික වැහීගෙන වැහීගෙන ගියොත් අන්න වික්‍රමකන්ද පාසලේ ළමයි 10 දෙනයි. එක ළමයාට එක ගුරුවරයයි. ඔන්න තත්ත්වය. එහෙම නම් අපි කියන්නේ මේ සබරගමුව පළාත් සභාව තීරණ ගන්න බැරි නම් මේ පළාත් සභාව අපි අහෝසි කරමු. ඉසුරුපායට බලතල දෙමු. එහෙම නම් මේ පළාත් සභාවෙන් වැඩක් නෑ.

ගරු ජී.එම්.කරුණාපාල.

ඉන්දියාවෙන් ගහයි.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

--------------------------------------------------

ඉන්දියාවෙන් වැඩක් නෑ. මේක කොන්ද කෙලින් තියාගෙන තීන්දු තීරණ ගන්න බැරි නම් මේ සබරගමුව

පළාත් සභාව අහෝසි කරන්න තමයි වෙන්නේ. විෂයය භාර ඇමතිවරයා නැති වුනත් ප්‍රධාන ඇමතිතුමා හැටියට මහීපාල ඇමතිතුමා ගැන විශ්වාසය තියලා මම සමුගන්නවා. හැබැයි ගරු සභාපතිතුමනි, මේක පටන් ගන්න බැරි වුනොත් ඊළඟ සභාවේ දී ගන්නා වූ ක්‍රියා මාර්ගය මොන අතකට හැරෙයිද කියන කාරණාව මම දන්නේ නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------
-

ස්තුතියි ! මීළඟට සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා. 58.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ගරු සභාපතිතුමනි, නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මේ බෝධිමළුව විද්‍යාලය ගැන ගත්තාම මේක සාමාන්‍ය පෙළට ගිහිල්ලා එතනින් අයින් වෙන ළමයි තමයි ගරු සභාපතිතුමනි, ඉන්නේ ගම්මානය ගත්තාම. මේ ගම්මානය අති දුෂ්කර ගම්මානයක්. ඒ වගේ මේ ඇති එකා නෙමෙයි, නැති එකා ඉගෙන ගන්න පාසලක් මේක. ඉතින් නැති එකා ඉගෙන ගන්න පාසල ප්‍රාථමික පාසලක් කරනවා කියන්නේ ළමයි අසරණ වෙනවා. මේවා මේ කවුරු ගන්න තීන්දු තීරණ ද අපි දන්නේ නෑ. හැබැයි මෙතන අපේ අධ්‍යාපන ඇමතිතුමා නැත්නම් පොල්පිත්තකින්වත් තියන්න කියන්න මේකට උත්තර ගන්න. ඇයි මේ දෙවියනේ මේක බලන්නකෝ ගරු ප්‍රධාන ඇමතිතුමනි.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
---------------------------------------------

එතුමාගේ දරුවාගේ අසනීප තත්ත්වයක් නිසා අද පැමිණීමට නොහැකි බව දන්වා තිබෙනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------

ඒක අපි දන්නේ නැහැනේ. එක්කෝ සභාවට කියන්න ඕන. සභාපතිතුමා අපිව දැනුවත් කරන්න ඕන. මේ ඇමතිතුමා නැත්තේ මේකයි කියලා. එහෙම නැත්නම් ඒ යෝජනාව දීපු මන්ත්‍රීවරයාට කියන්න ඕන මේ යෝජනාව වෙනත් දවසකට ගන්න කියලා ඒ ඇමතිවරයා. එහෙම කිව්වා නම් හරි මේක. වෙන්න ඕන ඒකයි.ඉතින් ගරු සභාපතිතුමනි, මම තදබලම විරුද්ධත්වයක් ප්‍රකාශ කරනවා මේකට. බෝධිමළුව විද්‍යාලය ගැන. අපි දන්න කියන විද්‍යාලයක්. මේක අද ඊයේ නෙමෙයි අවුරුදු 40 න්, 50 ක් තිස්සේ දන්නවා මේ විද්‍යාලය ගැන. සාමාන්‍ය පෙළට විතරයි ගරු සභාපතිතුමනි, දුප්පත් අසරණ දෙමව්පියන්ගේ දරුවෝ යන්නේ මේකට. එතනින් එහාට යන්න බලාපොරොත්තුවක් නෑ. මොකද ඇහැළියගොඩට යන්න වියදම් කරන්න විදිහක් නෑ. විවිධ ප්‍රශ්න.

ඉතින් ඒ නිසා බෝධිමළුව ගත්තාම මේකෙන් වෙන සේවය අති විශාලයි, ඒ ප්‍රදේශයේ

ජනතාවට. ඒ අති විශාල සේවයක් වෙන විද්‍යාලය මේක ප්‍රාථමිකයක් කරන්න යන්නේ මම දන්නේ නෑ මේ පිස්සෝ රැලක්ද මේක කරන්නේ කියලා. ඒකයි අපි මේක කථා කරන්නේ. දැන් මේ ආණ්ඩු පක්ෂයෙන් ගෙනාපු තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරයෙක් විපක්ෂයේ අපි මේ සහයෝගයට කථා කරන්නේ. මේවා නොකළයුතු වැඩ. ඒකයි අපි කියන්නේ. බලන්න ගරු සභාපතිතුමනි, අරවා දෙන්නම්, මේවා දෙන්නම්, භෞතික හා මානව සම්පත් නොඅඩුව දෙන්නම් කියලා ඒවායේ දීමනාවක් නෑ හැම පාසලකම ගත්තාම. ඉතින් ඒවාත් ලොකු අසාධාරණ. බෝධිමළුව විද්‍යාලය නම් කිසිසේත්ම ප්‍රාථමික විද්‍යාලයක් කරනවාට මගේ තදබල විරුද්ධත්වය මම ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි. මේ සාමාන්‍ය පෙළ දක්වා මම හොඳට දන්න දෙයක් අසරණ දෙමව්පියන්ගේ දරුවෝ යන්නේ. ඒ ළමයි එතනින් එහාට යන්නේ නෑ. උසස් පෙළ දක්වා යන ළමයි නෙමෙයි. යන්න වත්කමක් නෑ. ඒ නිසා සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගන්න තියන පාසල ඒ ආකාරයට කරන්න. ප්‍රාථමිකයට ළමයි ඕන තරම් ගන්න. ප්‍රාථමික විද්‍යාලයක්ම කරන්න ඕන නෑ. සාමාන්‍ය පෙළ විද්‍යාලය ඒ විදිහට තියලා ප්රාථමිකය දියුණු කරනවා නම් මෙන්න මේකට ළමයි යන්න ඕන කියලා නියෝගයක් කරන්න කියන්න. එච්චරයි. බොහොම ස්තූතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------
-

ස්තූතියි ! ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*

-------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, වචනයක් කථා කරන්න ඕන. නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමාගේ යෝජනාව වගේම ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කථා කළා රත්නපුර නගරයේ විශාල ප්‍රශ්නයක් තියනවා මේ දරුවන් ඇතුළත් කර ගැනීමේ ප්‍රශ්නය. මම දන්නේ නෑ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ගන්නා වූ යම් යම් තීන්දුත් එක්ක අපිත් ලොකු අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා විශේෂයෙන්ම පහුගිය රජය මහින්දෝදය විද්‍යාගාරයක් ලබාදෙන්නම් කියලා පාතගම විද්‍යාලය, දොඩම්පේ රාහුල විද්‍යාලය මේකේ ප්‍රාථමික අංශ නැති කළා. ඒ වගේම රත්නපුර නගරයේ සීවලි මධ්‍ය මහා විද්‍යාලය, සුමනා බාලිකා විද්‍යාලය ප්‍රාථමික අංශ නැති කළා. මේවා ක්ෂණිකව නැති කරපු ගමන්ම ප්‍රාථමිකයට යන්න ඉන්න දරුවන්ට අවස්ථාවක් නෑ නගරයේ පාසලකට. සීවලි මධ්‍ය මහා විද්‍යාලය වහපු ගමන්ම කිච්චේ හිදැල්ලන ආනන්දයට යන්න. පිරිමි දරුවන්ට කිච්චා කුමර විද්‍යාලයට යන්න. සුමනා බාලිකා විද්‍යාලය වහපුවාම කිච්චා ගැටන්ගම රාජකීයට යන්න. අද අපි සතුටු වෙනවා එක පැත්තකින් ඒ වැසී යන්න ගිය පාසල් අද යම්කිසි තත්ත්වයකට ඇවිල්ලා තියනවා. ගැටන්ගම රාජකීය, ඒ වගේම හිදැල්ලන ආනන්ද. හැබැයි ගරු සභාපතිතුමනි, මේ කොච්චර පාසල් ඇරුනත් නගරයේ තියන තදබදය, සමහර වෙලාවට නගරයේ ජීවත් වෙන අයට ඔප්පුවක් නෑ. දීර්ඝ කාලීන ප්‍රශ්නයක් මේක. ඔප්පුව නැති නිසා ලකුණු 10 ක් කැපුන ගමන්ම නගරයේ පාසලක් ඒ අයට හම්බ වෙන්නෙ නෑ. ඒ නිසා මම යෝජනා කළා පහුගිය වාර කීපයක දී යෝජනා කළා රත්නපුර නගරයට ප්‍රාථමිකයක් ලබාදෙන්න කියලා.

ඒ වගේම පහුගිය කාලයේ ආරම්භ කරන්න යෙදුනා රත්නපුර නව නගරයේ ප්‍රධාන පාසලක්. ඒකට ගිහිල්ලා මුල් ගල් පවා තිබ්බා. එහිදී ඒක මේ වෙනකොට මම දන්නේ නෑ මොකක්ද වෙලා තියෙන්නේ කියලා. මම යෝජනා කරනවා පළාත් සභාවට සිංහල මාධ්‍යය,

ද්‍රවිඩ මාධ්‍යය, ඉංග්‍රීසි මාධ්‍යය මේ කියන මාධ්‍යය තුනෙන්ම මේ මුල් ගල් තිබ්බ පාසල නැවත ආරම්භ කරන්න. මොකද රත්නපුරට විශාල අවශ්‍යතාවයක් තියනවා. ඒ වගේම අර වහපු ගඟබඩ සීවලිය ප්‍රාථමික විද්‍යාලයක් හැටියට නම් කරලා, ප්‍රාථමික විද්‍යාලයක් එතන ආරම්භ කරන්න කියලා. මේක තමයි අපි යෝජනා කරන්නේ. මොකද මේ ප්‍රශ්නයට විසඳුමක් නෑ නැත්නම්. පළාත් සභාව වියදම් කරනවා ගොඩනැගිලි හදන්න සෑහෙන්න. එහෙම නම් ඇයි මේ ප්‍රාථමිකයට මුදලක් වෙන් කරන්න බැරි ? ඒ නිසා මම යෝජනා කරනවා යම් යම් දෙපාර්තමේන්තු නිළධාරීන් අති මහත් දුෂ්කර ප්‍රදේශයක් වන කුඩාව නිල්වල කියන විද්‍යාලයේ ප්‍රාථමික ගුරුවරයා මාරු කළා. අද ආරම්භ කරනවා ප්‍රාථමිකයට ළමයි 6 දෙනයි, 7 දෙනයි ඉන්නේ. පාසලේම ඉන්නේ ළමයි 35 යි, 40 යි. නමුත් අද ප්‍රාථමික ගුරුවරයෙක් නෑ. මෙන්න මේවා මේ පහුගිය කාලයේ අපි කියනවා. අධ්‍යාපන නිළධාරීන්ට මම දන්නේ නෑ මොනවා වෙලාද කියලා. ගරු ප්‍රධාන ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපන ඇමතිවරයා වෙලා ඉන්න කොට ඔබතුමා මේ ප්‍රශ්නවලට අපට විසඳුම් ලබාදුන්නා. ඒ නිසා මේකට මැදිහත් වෙන්න. මැදිහත් වුනේ නැත්නම් රත්නපුරේ ඔබතුමා අරන් දුන්න ප්‍රතිඵල තව අවුරුද්දකින්, දෙකකින් නැති වෙනවා. මේක කථා කරන්නේ නැතුව ඉන්න බෑ. ඒකයි මේක කථා කරන්නේ. ඒ නිසා මේකට මැදිහත් වෙන්න කියලා ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------------
-

ගරු ප්‍රධාන ඇමතිතුමාට අවස්ථාව.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*

-----------------------------------------

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා මට අද මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් දැනුම් දීමක් කළා. මමත් එතුමා වගේම මේ විෂයයට බොහොම ආදරෙයි. මේ විෂයය ගැන අද කථා කරනකොට මේ බෝධිමළු විද්‍යාලය, ඇරැපොල විද්‍යාලය, සිරි සමන් විද්‍යාලය සහ විජේනායක විද්‍යාලය. අපි මේ ධර්මපාල විද්‍යාලයේ තිබුණ සමාන්තර පන්ති 10 තව තවත් වැඩි කරන්න ඉල්ලන නිසා මේ පාසල් 4 අපි සංවර්ධනය කළා. ඒකෙන් විජේනායක විද්‍යාලය විශේෂයෙන් අපි ගොඩනැගිලි හදලා දුන්නා. බෝධිමළුව විද්‍යාලයත් එහෙමයි. විජේනායක විද්‍යාලයේ අන්තිමට නම වෙනස් කරන්න කිව්වා. නමුත් ඒ නම එසේම ස්ථිරවම තවත් අද තියනවා. ඒ පාසල අද සංවර්ධිත පාසලක් බවට පත්වෙලා තියනවා. අර බෝධිමළුව විද්‍යාලයේ ඇති වෙච්ච ප්‍රශ්නය බොහෝ පාසල්වලට සිද්ධ වෙලා තියනවා. ඒ කාරණාව නැවත ක්‍රියාත්මක කරන්නත් දැන් පුළුවන් තත්ත්වයක් තියනවා. ප්‍රාථමික පන්ති අයින් කරපු පාසල්වලට ප්‍රාථමික පන්ති නැවත ආරම්භ කරන්න අවසරය දෙනවා. ඒ වගේම ප්‍රාථමික පන්ති පමණක් කරපු පාසල්වලත් ඉඩකඩ අනුව අපට කරන්න පුළුවන්.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි ඒක අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා බෝධිමළුව විද්‍යාලය අපි ප්‍රාථමික පන්තිවලින් ඉහළ පන්තිවලට යන ආකාරයෙන්ම උසස් වෙලා යන්න අපි ඉදිරියේ දී කටයුතු කරන්න කටයුතු කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපට තියනවා අපේ රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා මතක් කෙරුවා 35 දෙනෙකුට පන්ති සීමා කරලා තියනවා. මෙවැනි කරුණු අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි, සංවිධායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියටනේ බොහොම විශිෂ්ඨ විදිහට රඟපෑවේ. සංවිධායකකම

අමතක වෙනවා. ගරු සභාපතිතුමනි, මේක එක පාරටම 35 ට සීමා කළාම අපට ගුරුවරුන්ගේ ප්‍රශ්නයක් එනවා. අපට ගොඩනැගිලිවල ප්‍රශ්නයක් එනවා. මේවා ක්‍රමානුකූලව සකස් කිරීමෙන් පස්සේ තමයි මෙවැනි තීරණ ගතයුත්තේ. මේ ක්ෂණික තීරණ ගැනීමෙන් අද අධ්‍යාපනයේ අද විදුහල්පතිවරුන්ට මේ සම්බන්ධයෙන් තීන්දු ගැනීම සඳහා බොහොම අසීරු තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා මේවා මම හිතන්නේ අනෙකුත් භෞතික සම්පත් ලබාදෙමින් තමයි අපේ සබරගමුව පළාතේ අපි මේ තරඟ විභාගවල පළවෙනි තැනට එන්න අපි පාසල් ගෙනාවේ. ඉතින් ඒ නිසා විශේෂයෙන්ම රත්නපුර නගරය ගත්තාම ගරු සභාපතිතුමනි, හොඳ පිරිමි පාසලක අඩුවක් අපි දකිනවා. මොකද සුමනා බාලිකා පාසල තියනවා. ෆර්ගියුෂන් බාලිකා පාසල තියනවා. නමුත් පිරිමි පාසලක් සඳහා මම හිතන්නේ අපේ හිටපු ජනාධිපතිතුමාගේ කාලේ මුල්ගල තිබ්බ පාසල තියනවා අක්කර 10 ක්. අපි ඒකේ මේ මාධ්‍යය තුනෙන්ම වගේ සිංහල, ඉංග්‍රීසි, ද්‍රවිඩ මාධ්‍යය තුනෙන්ම පාසලක් ආරම්භ කරන්න කටයුතු කළොත් හොඳයි කියන එක අපි මේ ගරු සභාවේ දී අපි යෝජනා කරනවා. මේ අවුරුද්දේ අපි ඒක ක්‍රියාත්මක කරමු මේ පළාත් සභාවේ. අපේ භාණු ඇමතිතුමාත් එක්ක එකතු වෙලා. ඒ නිසා ඒ වගේම

රංජිත් ඇමතිතුමා මතක් කළා ගඟ ලඟ වහලා තියන පාසල. ඒ පාසල ප්‍රාථමික පාසලක්, පිරිමි පාසලක් ලෙස ආරම්භ කරන්නත් මම හිතනවා රත්නපුර නගරයේ කටයුතු කරනවා නම් මේ කියන ප්‍රධාන නගරයක තියන මේ දරුවන්ගේ ඇතුල් කිරීමේ තදබදය අපට පුළුවන් අවම කරගන්න. ඒ එක්කම ප්‍රාථමික පන්තිවල උසස් පන්ති දක්වා, ඒ වගේම ද්විතික පාසල්වල නැවත ප්‍රාථමික පන්ති ආරම්භ කිරීම සඳහා අපට අනුමැතිය ගන්න වෙලා තියනවා, අපේ ගරු රත්නායක මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. අපි ඒක කරන්නේ නැතුව හිතුවක්කාරකමට අපි ගත්තොත් ලැබෙන පහසුකම් ඒ පාසල්වලට ලබා ගැනීමේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන් ලොකු අපහසුවක් ඇතිවෙන නිසා එවැනි අවස්ථාවල දී රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ගරු අමාත්‍යතුමාගෙන් අරගෙන තමයි දැනට එවැනි පාසල්වල අපි ආරම්භ කරන්න අපහසුතාවයක් නෑ. ඒ නිසා ගරු සභාවට අපේ අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේ දී එතුමාගේ දරුවෙකුගේ අසනීපයක් නිසා නොපැමිණීම ගැන මට දැන්වුවා. මම ඒ වගකීම භාරගන්න බව ප්‍රකාශ කරමින් බෝධිමළුව විද්‍යාලය සම්බන්ධයෙන් නමින්ද ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අනුව අපි ඒකේ 6 පන්තියෙන් ඉහළ පන්ති ආරම්භ කරන්න අපි අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන ඇමතිතුමනි.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

රංජිත් ඇමතිතුමා යෝජනා කළා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන් ආරම්භ කරන පාසල ආරම්භ කරන්න කටයුතු කරන්න කියලා. මම ස්ථිර කරනවා. ඉතාම කාලෝචිත, වැදගත් ඒ යෝජනාව අපි කරමු කියලා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

-------------------------------------------------

ගරු සභාපතිතුමා, ප්‍රධාන අමාත්‍යතුමාගෙන් කියවුනා ද්විතික පාසල්වල අවසරය ලබාගන්න ඕන කියන කාරණාව. ඒක ලිඛිතව දීලා තියනවා. හැබැයි ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමනි, ඇරැපොල මහින්ද මහා විද්‍යාලය නැවත වරක් ගමේ පාසල හොඳම පාසල බවට නම් කරලා තියනවා. එතකොට ගමේ පාසල හොඳම පාසල බවට නම් කළාම ඉසුරුපායෙන් ඇහුවාම කිව්වේ 1 වසර තිබුණට ප්‍රශ්නයක් නෑ කියන කාරණාව. එතකොට ද්විතීක පාසල නැවත වරක් ගමේ පාසල හොඳම පාසල බවට නම් කරලා තියනකොට හැබැයි 1 වසර පටන් ගන්න අවසර දෙන්න පුළුවන්කම තියනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------------

හරි අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමන්ලා. විශේෂයෙන්ම අපේ නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව පක්ෂ විපක්ෂ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් යොමු වුනේ ගරු ඇමතිතුමාගේ, ගරු ප්‍රධාන ඇමතිතුමාගේ සියළුදෙනාගේම අදහස් යොමු වුනේ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

--------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කළා මේ යෝජනාව සමඟම සංශෝධනයක්. මම හිතන්නේ මහ ඇමතිතුමාගෙන් ඒක ප්‍රකාශ වුනේ නෑ. අත්‍යාවශ්‍ය, ජනප්‍රිය පාසල්වල තිබුණ පන්ති ප්‍රමාණය එලෙසම පවත්වාගෙන යායුතුයි කියලා. අන්න ඒකටත් මම පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------------
-

හරි. දැන් මේ මූලාසනයේ කටයුතුවලට ඉඩකඩ දෙන්න. දැන් එතකොට නමින්ද අනුරප්‍රිය මැතිතුමා ඉදිරිපත් කරපු යෝජනාවට පක්ෂව තමයි සියළුදෙනාම යෝජනා අදහස් ඉදිරිපත් කළේ. ඉතින් මේ අවස්ථාවේ දී ගරු අධ්‍යාපන ඇමතිතුමා සභාවේ නොහිටියා වුනත් හිටපු අධ්‍යාපන ඇමතිතුමා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඒ වගකීම භාර අරගෙන ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද පරිදි අදාළ අධ්‍යාපන අමාත්‍යාංශයට මේ කරුණු යොමු කරලා, අධ්‍යාපන ගරු ඇමතිතුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නිළධාරීන් එක්ක විධිමත් ආකාරයට මේ කටයුතු නිරාකරණය කරලා දෙන්න කියන එක තමයි හැම පාර්ශවයෙන්ම ඉල්ලීම ආවේ. ඒ නිසා ඒ කාරණාව පිළිබඳව ඉදිරිපත් කරන ලද සියළුම සංශෝධනයන් එක්ක ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ වගේම ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, අධ්‍යාපන ලේකම්තුමාටත් යොමු කරනවා ඉතාම කඩිනමින් මේ ඉදිරිපත් කරන ලද සංශෝධනයන් සහිතව මේ කටයුත්ත කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේ දී දැනුම් දෙනවා.

මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු සභානායකතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

සභාපතිතුමනි, පොඩි දෙයක් තියනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------
-

දැන් අපි ඉවර කරන්න ඕන මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
------------------------------------------

ගරු ප්‍රධාන ඇමතිතුමා සම්බන්ධීකරණ කමිටුවේ දී සම සභාපතිවරයා වශයෙන් ගත්ත තීරණයක් අනුව, මම හිතන්නේ මේ අපි හැමෝටම තියන ප්‍රශ්නයක්. සමහර පාසල්වල ඔබතුමාම කිව්වා 1 වසර එක පන්තියක් ආරම්භ කරන්න කියන එක. ඔබතුමා ඉන්න සම්බන්ධීකරණ රැස්වීමේ. මේ රත්නපුරේ මම දන්නවා හිග්ගස්වත්ත කණිෂ්ඨ විද්‍යාලය, ඒ වගේම රත්නපුරේ තියනවා පාසල් කීපයක්. මේකෙදී ආරම්භ කරන්න විදිහක් නෑ 14 වෙනිදා. ඒ නියෝගය තවම ගිහිල්ලා නෑ. මොකද අධ්‍යාපන ඇමතිතුමා ඒ වෙලාවේ හිටියෙත් නෑ. එදත් එතුමා ඉදලා ටක් ගාලා ගිය නිසා ඒ යෝජනාව තිබුණා. නමුත් දැන් වෙලා තියන ප්‍රශ්නය 14 වෙනිදා පන්ති ආරම්භ කරනවා. ආරම්භ කරනකොට මේ පාසල පිළිබඳ ගැටළුවක් තියනවා. මේක ඇත්තටම අපට තියන ප්‍රශ්නය මොකක්වත් නෙමෙයි එදාත් එතුමා ගියා. ඔබතුමා තීරණයක් ගත්තා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා රංජිත් බණ්ඩාර ඇමතිතුමා කියපු විදිහට මෙතන ලේකම්තුමා හිටියා නම් උපදෙස් දෙනවා. මොකද 14 වෙනිදා පටන් ගන්නවා. අද 12 වෙනිදා. තව දවස් 2 යි. ඒ දරුවන්ට පළවෙනි දවසේ පාසලට යන්න විදිහක් නෑ. පැහැදිලිව සුදුසුකම් තියනවා. අපි අර 35, 40 දක්වා යැම තුළ ළමයි 5 දෙනා, 10 දෙනා වෙච්ච සමහර පාසල්වල නැතිකම නිසා අද පාසල නෑ. ළමයි මානසිකව වැටෙනවා. මම හිතන්නේ ප්‍රධාන ඇමතිතුමා මේකට මැදිහත් වෙලා තීරණයක් අරගෙන විසඳුමක් දෙන්න.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------

ඒ ළමයි තියන පන්තිවලට ගන්න කියලා නියෝගයක් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------
-

දැන් මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා මූලාසනයෙන් තීන්දුවක් ගත්තා පස්සේ ආයේ තවත් වෙලාවල් ඉල්ලලා කථා කරන්න එපා. මූලාසනයෙන් ඒ කථාව අවසන් කළාට පස්සේ ආයෙත් කථා කරන්න එපා. එහෙම නම් තමුන්නාන්සේලා වෙලාවක් ඒකට ඉල්ලන්න. තමුන්නාන්සේලා විවාදයක් ඉල්ලා ගන්න. මේක නිකම් මූලාසනය හැල්ලුවට ලක් වෙනවා නේ තීන්දුවක් අරගත්තාට පස්සේ තව කෙනෙක් කථා කරනවා. මාරුවෙන් මාරුවට කථා කරනවා. මට ඒක කරන්න බෑ. ඒ නිසා කරුණාකරලා තමුන්නාන්සේලා කාට වුනත් අවස්ථාව තියනවා . වෙලාව දීලා තිබුණා. ඉතින් ඒක කරන්න. මම හරි අපහසුතාවයට පත් වෙනවානේ. දැන් මම සභානායකතුමාට යෝජනා කරනවා කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා.

අසෝක ජයවර්ධන.

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 ජනවාරි මස 26 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා. ඒ වගේම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා පසුගිය වසර තුළ මේ සභාවේ කටයුතු ඉතාම සාර්ථකව ඉදිරියට ගෙනිහිල්ලා ඉතාම සාර්ථක සභාවක් බවට පත් කිරීම පිළිබඳව. මම මේක අවස්ථාවක් කරගන්නවා සඳහන් කරන්න ඇමතිවරයෙක් නැති වූ පළියට මේ සභාවේ සිදුවෙන කාරණා පිළිබඳව, යෝජනා පිළිබඳව ඉදිරි කටයුතු සිදුවීම වැළැක්වෙන්නේ නෑ. ඒවා නියම ආකාරයෙන්ම සිදුවෙනවා කියන එක මන්ත්‍රීතුමන්ලාට දැනුම් දීමටත් මම මේක අවස්ථාවක් කරගන්නවා. ඒ වගේම මේ ලැබුවා වූ නව වසර ඔබතුමාටත්, ප්‍රධාන ඇමතිතුමාටත්, කැබිනට් මණ්ඩලයටත් ඒ වගේම විපක්ෂනායකතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියට, ඒ වගේම කාර්යය මණ්ඩලයට, අපේ සභාව ආවරණය කරන මාධ්‍යය කණ්ඩායමට, ඉතාම වාසනාවන්ත සුභ නව වසරක් වේවා ! කියලා මම ප්‍රාර්ථනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සභානායකතුමනි. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම හිතනවා මේක අපේ යුතුකමක් කියලා. මොකද අද කථා කරපු හැම මන්ත්‍රීවරයෙක්ම එළියේ දී මුණගැහුන හැම මන්ත්‍රීවරයෙක්ම කිව්වේ හරියට පාර්ලිමේන්තුවට ආවා වගේ දැනෙනවා කියලා. එච්චර ලස්සනට, එච්චර ගෞරවාන්විත විදිහට මේ ගරු සභාව සකස් කිරීම පිළිබඳව විශේෂයෙන්ම මේකට මූලිකව කටයුතු කරපු අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ කාරණාව ඉතාම නිවැරදිව ඉෂ්ඨ කරපු ඔබතුමාටත්, ඒකට සහය දීපු අනෙක් සියළුදෙනාටත් ස්තුති කිරීම, ප්‍රශංසා කිරීම අපේ යුතුකමක් හැටියට මම සළකනවා. මොකද විශේෂයෙන්ම කියන්න ඕන බුදුහාමුදුරුවොත් බුදු වෙන්න ඉස්සෙල්ලා පස්මහ බැලුම් බලනකොට උන්වහන්සේ තීන්දු කලේ රජ පවුලක උපදින්න. එහෙම නැති වුනාම ඒක එතෙන්ට ගැලපෙන්නේ නෑ කියලා. ඒ නිසා ඒ තීන්දු කලේ ජනතාවට එහෙම නැත්නම් යමක් දීමේ දී ඒ වටපිටාව, පරිසරය නිවැරදිව කිරීම අත්‍යාවශ්‍ය නිසා. ඒ නිසා සබරගමුව පළාත් සභාව ලංකාවේ තියන සියළු පළාත් සභා අභිබවලා ඉතාම විශිෂ්ඨ පළාත් සභාවක් බවට පේන තැනක් බවට පත් කිරීමට මේ කරන ලද කාරණාව සම්බන්ධයෙන් ඒ සියළුදෙනාට, ප්‍රධාන අමාත්‍යතුමා, ඔබතුමා ඇතුළු ඔබතුමාට සහය දීපු අනෙක් සියළුදෙනාට අපේ ගෞරවනීය ස්තුතිය සහ ප්‍රශංසාව පිරිනමන්න මේක අවස්ථාවක් කරගන්නවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

-

ස්තුතියි ! ගරු රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමනි. මීළඟට ගරු මන්ත්‍රී බී.ආරියවංශ මැතිතුමා.

***ගරු මන්ත්‍රී බී.ආරියවංශ***
***கௌரவ உறுப்பினர் பீ.ஆரியவங்ஷ***
*Hon.Member B.Ariyawansha*

---

ගරු සභාපතිතුමනි, ඒ වගේම ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යවරුනි, මන්ත්‍රීවරුනි, හදිසි යෝජනා යටතේ මටත් තියෙන්නේ මේ ප්‍රදේශයේ පාසලක් සම්බන්ධව කියන්න. මොකද කැල්ලගම ප්‍රාථමික පාසලේ මේ වෙනකොට ළමයි 102 දෙනෙක් ඒ පාසලට ඉල්ලුම්පත්‍ර කැඳවලා තිබෙනවා. මේ වෙනකොට පන්ති දෙකයි තියෙන්නේ. ඒ නිසා ළමයි 28 දෙනෙක් ඉන්නවා ඒ පාසලට ඇතුළත් කරගන්න බැරුව. මොකද ඒ අවට ඉන්න ළමයි. මොකද මේ අයට යන්න වෙනත් පාසලක් ඒ අවට නෑ. තියෙන්නේ ඉතාම දුෂ්කර ප්‍රදේශයක තියන පාසල්. ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමාගෙන්, ඒ වගේම අධ්‍යාපන ඇමතිතුමා සමඟ මම උදේ දුරකථනයෙන් කථා කළා. එතුමා කිව්වා අද සභාවට එන්න වෙන්නේ නෑ කියලා. එමනිසා පන්තියක් අලුතෙන් අනුමත කරලා දෙන්න කියලා ඒ ප්‍රදේශයේ දෙමව්පියන්ගේ ඉල්ලීම තියෙන්නේ. මේක කඩිනමින් කරන්න අවශ්‍යතාවයක් තියෙන්නේ. මොකද ඒ ප්‍රදේශයේ දරුවන්ට අධ්‍යාපනය ලබන්න අවස්ථාව සකස් කරලා දෙන්න ඕන. එමනිසා ගරු සභාවෙන් මම මේ අවස්ථාවේ දී ගරු සභාපතිතුමනි, ඉල්ලා සිටිනවා කඩිනමින්, මොකද තව දවස් කීපයයි තියෙන්නේ. එමනිසා පළාත් අධ්‍යාපන ඇමතිතුමාත් ඒ පාසලට ගිහිල්ලා තිබුණා. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කියලා තිබුනේ අලුත් පන්තියක් අනුමත කරන්න බෑ කියලා. මොකද ඒත් ඒ පාසලේ ඉඩකඩ තියනවා. ගුරුවරු ඉන්නවා. සියළු පහසුකම් තියනවා. එමනිසා හැකි ඉක්මණින් ඒ කටයුත්ත කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම කොලොන්න රෝහලේ එකම එක පවුල් සෞඛ්‍ය සේවිකාවක් තමයි ඉන්නේ ඒ වාට්ටුවට. 6 දෙනෙක් අනුමතයි. එමනිසා මේ වෙනකොට ඒ පවුල් සෞඛ්‍ය සේවිකාවට මාරු වීමක් ඇවිල්ලා තියනවා. එමනිසා ඒ රෝහලේ වාට්ටුව වහන්න තමයි උදාවෙලා තියෙන්නේ තත්ත්වයක්. එමනිසා මම ප්‍රධාන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා හැකි ඉක්මණින් ඒ මාරුවීම අවලංගු කරලා දෙන්න. එහෙම නැත්නම් වෙනත් කීප දෙනෙක් ඒ රෝහලේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් වශයෙන් ඇතුළත් කරලා දෙන්න කියලා ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී නව වසරේ ගරු සභාපතිතුමාටත්, ඒ වගේම ප්‍රධාන ඇමතිතුමා ඇතුළු සියළුම ඇමතිතුමන්ලාටත්, ඒ වගේම පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීතුමන්ලාටත්, ඒ වගේම සභා ලේකම්තුමා, සියළුම ලේකම්තුමන්ලා ඇතුළු සියළුම කාර්යය මණ්ඩලයටත් ලැබුවා වූ 2016 වර්ෂය සියළුදෙනාටම සුභ නව වසරක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරමින් ඉදිරි වැඩ කටයුතු කරගෙන යන්න ශක්තිය හා ධෛර්යය ලැබේවා ! කියලා ප්‍රාර්ථනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු ආරියවංශ මන්ත්‍රීතුමාට. මීළඟට ප්‍රභාත් ද අල්විස් මැතිතුමා. එතුමා සභාවේ නෑ. මීළඟට අකිල එල්ලාවල මැතිතුමාගේ අවස්ථාව.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*

---

ගරු සභාපතිතුමනි, නැවතත් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයක්. බලන්ගොඩ ශ්‍රී බුද්ධ ජයන්ති විද්‍යාලයේ පවතින පරිපාලන ගැටළුවක් සම්බන්ධවයි මම අදහස් දක්වන්නේ. ප්‍රාථමික විද්‍යාලයේ තියනව 1 සිට 5 දක්වා දරුවන් අධ්‍යාපනය හදාරනවා. 5 වෙනි වසර තියනවා E කියලා පන්තියක් හදාගෙන විදුහල්පතිවරයා. මේ 5 E කියන පන්තියට ඇතුළත් කරන්නේ බුද්ධි මට්ටම අඩු දරුවෝ තමයි මේ 5 E කියලා යොමු කරන්නේ. ඉතින් මේක ඉතාම දැඩි ප්‍රශ්නයක් බවට පත්වෙලා තියනවා ප්‍රදේශයේ. මොකද අද උදේ පාන්දර දෙමව්පියෝ දෙන්නෙක් එනවා ඊයේ වෙනකල් මගේ දරුවා හිටියේ B පන්තියේ. නමුත් ඊයේ ඉඳන් E පන්තියට මගේ දරුවා මාරු කරලා කියලා. E පන්තියට මාරු කරන්නේ බුද්ධි මට්ටමින් අඩු දරුවෝ කියලා. ඉතින් මේකට ගුරුවරයෙක්වත් නෑ. ඉතින් මම නම් අද උදේ තමයි දන්නේ මෙහෙම තත්ත්වයක් තියනවා කියලා. ලංකාවේ කිසිම පාසලක මේ වගේ පන්තියක් වෙනම අඩු බුද්ධි මට්ටමක් තියන දරුවෝ ඉන්න පන්තියක් කියලා කොහේවත් අහලා නෑ අපි. ඉතින් මේක මම හිතන්නේ අපේ අධ්‍යාපන ඇමතිතුමාගෙත් ආසනයමයි. එතුමාත් දන්නවාද දන්නේ නෑ මේ පිළිබඳව. ඉතින් මේක අද ඊයේ වෙච්ච දෙයක් නෙමෙයි. අවුරුදු 4 ක් තිස්සේ පන්තිය පවත්වාගෙන ගිහිල්ලා තියනවා. ඉතාමත් කණගාටුදායකයි. මේ වගේ තත්ත්වයක් මම හිතන්නේ බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාවත් දන්නවා ද දන්නේ නෑ. ඉතින් දෙමව්පියෝ මේ ගැන පැමිණිලි කළාම විදුහල්පතිවරයා කියලා තියනවා තියාගන්න බැරි නම් දරුවා අස්කරගෙන යන්න කියලා පාසලෙන්. ඉතින් මේක ඉතාම අසාධාරණ ඉල්ලීමක්. අසාධාරණ තත්ත්වයක්. මම ඉල්ලීමක් කරනවා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් සාධාරණයක්. මේක පෙත්සමක් නෙමෙයි. දෙමව්පියෝ නමින් මට ඉදිරිපත් කළේ. ඒ නිසා මේක කරුණාකරලා අධ්‍යාපන ලේකම්තුමා මේ වෙලාවේ ඉන්නවා නම් මම මේක සභාගත කරනවා එතුමන්ලාගේ දැන ගැනීම පිණිස.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු අකිල එල්ලාවල මැතිතුමාට. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

---

ගරු සභාපතිතුමනි. මම මේක අවස්ථාවක් කරගන්නේ ලැබුවා වූ නව වසර ගරු ප්‍රධාන ඇමතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත් ඒ වගේම විපක්ෂනායකතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියට සහ විශේෂයෙන් ඔබතුමාටත් මේ නව වසර සුභ නව වසරක් වේවා ! යි ප්‍රාර්ථනා කරන අතර, ගරු සභාපතිතුමනි, මොකද අවුරුදු කීපයක් තිස්සේ යම් ක්‍රමවේදයකට ගිහිල්ලා නැවත වරක් අද උදේ විවෘත කළා. මොකද අඩුපාඩුකම් ටික හදලා පාර්ලිමේන්තු සංකීර්ණයට සමාන වෙද්දී විශේෂ අඩුපාඩු ටිකක් හැදුවා. යම් යම් චෝදනාත් ඔබතුමාට එන්න ඇති. මම පෞද්ගලිකව දන්න කාරණයක් තමයි අනෙක් අයට කියනවා නෙමෙයි ඔබතුමාගේ යම් ක්‍රමවේදයක් තියනවා, වැඩ පිළිවෙලක් කරනකොට. දැක්මක් තියනවා. මම ඔබතුමා උඩ තියලා මට ලකුණු ගන්න නෙමෙයි මේ කථා කරන්නේ. හරි දේ හරි නම් හරි, වැරදි දේ වැරදි හැටියට තමයි මම දකින්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, කොච්චර වියදම් ගියත් මේකේ අඩුපාඩුකම් හදලා, පාර්ලිමේන්තු සංකීර්ණය විදිහටම මේක ගේන්න පුළුවන් වීම ගැන මගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, තව අඩුපාඩු ටිකක් තිබෙනවා. මම හිතන්නේ ඒක ඔබතුමා දන්නවා ඇති. අජිත් කුමාර මන්ත්‍රීතුමාත් කිව්වා මේ සිවිලිම පිළිබඳව. ඒ වගේම තව අඩුපාඩුකම් තියන ඒවා හදලා පාර්ලිමේන්තු සංකීර්ණය බවටම පත් කරන්න ඔබතුමාට හැකියාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමනි. මීළඟට ගරු බාස්කරන් මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී බාස්කරන් මැතිතුමා.***
***கௌரவ அண்ணாமலை பாஸ்கரன்***
*Hon Member Annamalei Basgaran*

-----------------------------------------------------------

கௌரவ தலைவர் அவர்களே! முதலமைச்சர் உட்பட அமைச்சர்மார்களே , எதிர்க்கட்சி தலைவர் உட்பட மந்திரிமார்களே ! உங்கள் அனைவருக்கும் எனது புத்தாண்டு வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.கௌரவ தலைவர்களே இந்த சபையில் இதற்கு முன்பு நான் எடுத்துக் கூறியிருக்கிறேன் , எங்களுடைய பெருந்தோட்டத்துறையைச் சேர்ந்த மக்களுக்கு ஏற்படும் பிரச்சினைகளைப் பற்றி , அந்த பிரச்சினைகளில் மிகவும் முக்கியமான பிரச்சினை தபால் பிரச்சினை கடிதப் போக்குவரத்து நான் ஏற்கனவே கூறியிருந்தேன் எங்களுடைய பெருந்தோட்டத்துறையைச் சேர்ந்த மக்களுக்கு இந்தக் கடிதங்களை மக்களுக்கு கொடுக்கும் போது மிகவும் சிக்கல்களுக்கு உள்ளாகி இருக்கின்றார்கள்.அதாவது தொழில் நிமிர்த்தமாக அவர்களுக்கு *Application* கிடைக்கும் பொழுது அந்த கடிதங்கள் சரியான நேரத்தில் சென்றடைவதில்லை.கடந்த முறை உதவி ஆசிரியர் நியமனம் கொடுக்கும் பொழுது நாங்கள் கடிதங்களை அனுப்பி இருந்தோம் அந்த கடிதங்கள் அவர்களுக்கு *Interview* திகதிக்கு பின்பு தான் அந்தக் கடிதங்கள் கிடைத்து இருக்கின்றது.இது மிகவும் பாரதூரமான விடயம்.இன்று பெருந்தோட்டத்துறையைச் சேர்ந்த மக்கள் அவர்கள் வங்கி வரை சென்று அவர்களுடைய பிள்ளையின் சுகவீனம் காரணமாக அல்லது மிகவும் அத்தியாவசியமான தேவைக்கு அல்லது மரண வீட்டின் தேவைக்கு அவர்களிடம் இருக்கும் ஒரு நகை அல்லது காதில் இருக்கும் தோடு அவருடைய *Chain* கொண்டு வங்கியில் ஈடு வைத்தால் அந்த வங்கியில் இருந்து ஒரு திகதி கொடுத்து இருப்பார்கள்.அந்த திகதியில் இருந்து திருப்ப வேண்டும் என்று ஆனால் அந்தக் கடிதம் அந்த திகதியில் கிடைக்காததன் காரணமாக நிறைய பேர் மிகவும் கஷ்டத்திற்கு உள்ளாகி இருக்கின்றார்கள். அதாவது ஒரு பவுன் *Chain* ஐ குறைந்த விலைக்கு வைத்திருப்பார்கள். அவர்களால் திருப்ப முடியாமல் போகும் போது அந்த *Chain* இல்லாமல் போய்விடுகின்றது. இந்த அதியுயர் சபைக்கு கௌரவ தலைவர் அவர்களே நான் எடுத்துக் கூறி இருக்கின்றேன்.ஆகவே மிகவும் தாழ்மையுடன் உங்களிடம் கேட்டுக் கொள்கின்றேன்.நாங்கள் இங்கு பேசுவது வெறுமனே பேசுவதாக மாத்திரமாக இருக்கக் கூடாது.தயவு செய்து இது சம்பந்தமாக கேகாலை மாவட்டம் இரத்தினபுரி மாவட்டத்தில் இருக்கும் பெருந்தோட்டத்துறை மக்களுக்கு இந்த தபால் ஊழியர்களை, எங்களுக்கு தபால் ஊழியர்களை இலங்கை தொழிலாளர் காங்ரஸின் சார்பாக எங்களுடைய முன்னால் ஜனாதிபதி சந்திரிக்கா அம்மையாரினால் கிடைத்து இருக்கின்றது.அந்த தபால் ஊழியர்கள் இரத்தினபுரி மாவட்டத்திற்கும் கேகாலை மாவட்டத்திற்கும் கிட்டத்தட்ட பத்துப் பத்து ஊழியர்கள் தான் கிடைத்து இருக்கின்றார்கள்.அன்று சந்திரிக்கா அம்மையார் விடைப் பெற்று 1994 இல் இருந்து எத்தனை வருடங்கள் ஆகி விட்டன அதன் பிறகு ஒருவரைக் கூட பெருந்தோட்டத்துறைக்கு தபால் ஊழியர்களாக பெற்றுக் கொடுக்கவில்லை.ஆகவே தயவு செய்து இந்த அதியுயர் சபைக்கு கேகாலை மாவட்டத்தில், இரத்தினபுரி மாவட்டத்தில் மக்கள் சார்பாக உங்களிடம் கேட்டுக் கொள்கின்றேன்.இது சம்பந்தமாக தெளிவுபடுத்தி உடனடியாக கேகாலை மாவட்டத்திற்கும் இரத்தினபுரி மாவட்டத்திற்கும் தோட்டப்புரங்களுக்கு தமிழ் தபால் ஊழியர்களை பெற்றுத் தர வேண்டும் என்று கேட்டு விடைப் பெறுகின்றேன் நன்றி வணக்கம்.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු බාස්කරන් මන්ත්‍රීතුමනි. මීළඟට ගරු පී.අබේනායක මන්ත්‍රීතුමා.

*ගරු පී.අබේනායක මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் பீ.அபேநாயக*
*Hon.Member P.Abeynayaka*

---

ගරු සභාපතිතුමනි, ඇඹිලිපිටිය තරුණයාගේ ඝාතනය සම්බන්ධව මම නගරයේ ජීවත් වෙන පුද්ගලයෙක් හැටියට, මහජන නියෝජිතයෙක් හැටියට, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට ඇත්තටම ඒ සිද්ධිය මම ඇසින් දුටුවේ නෑ. නමුත් ඒ සිද්ධිය වෙච්ච ස්ථානයේ ඉන්න අය කියන විදිහට ඇත්තටම ඒක හරි අසාධාරණ විදිහට, අමානුෂික මරණයක් කියන එක, අමානුෂික අන්දමින් ප්‍රහාර එල්ල කරලා ඝාතනය කිරීමක් කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න ඕන. නමුත් ඇත්තටම ඒ ඝාතනය සිද්ධ වුන ස්ථානයේ පුංචි දැරියකගේ සාදයක් තිබුණා. ඒ සාදයට මටත් ආරාධනා කරලා තිබුණා. නමුත් මට ඒකට ඒ අවස්ථාවේ යන්න බැරි වුනා. නමුත් එදා ඒ සිද්ධිය වුන දවසේ උදේ පාන්දර මගේ නිවසට ඒ සිද්ධිය වුන ස්ථානයේ කිහිප දෙනෙක් පැමිණිලා ඒ ගෙදර අයිතිකරු සමඟ මගෙන් ඉල්ලා සිටියා මේ වගේ අසාධාරණ වැඩක් වුනා. මේ වගේ ප්‍රහාරයක් එල්ල කළා කියලා. ඒ වෙලාවේ ඒ ස්ථානයට පැමිණිය ගෙදර අයිතිකරුටත්, ඒ සිද්ධියට මුහුණ දුන්න අයටත් මම කිව්වා රත්නපුරේ ඩී.අයි.ජී. ඔෆිස් එකට ගිහිල්ලා නැත්නම් එස්.එස්.පී.කාර්යාලයට ගිහිල්ලා පැමිණිලි කරන්න කියලා. නමුත් ඒ පැමිණිල්ල කරන්නේ නැතුව ඇඹිලිපිටියට ගියාට පස්සේ ඒ ගෙදර හිමිකරු සහ එතන ඉන්න ගොඩාක් පිරිසක් අත් අඩංගුවට අරගෙන පොලීසියෙන් අත් අඩංගුවට අරගෙන ඊයේ තමයි ඇප දුන්නේ. ඊයේ තමයි නඩුව තිබුනේ. අසාධාරණය ගැන බැලුවාම, ඒ සිද්ධිය වුන තැනට ගිහිල්ලා බැලුවාම ලොකු ප්‍රහාරයක් එල්ල කරලා තියනවා. එදා රෑ 11.30 ට, 12.00 ට විතර පොලිස් ජංගම සේවාවේ යෙදෙන ඒ පොලිස් සංචාරක ජීප් රථයක් එතනට ගිහිල්ලා, ඊට පස්සේ ඒ සාදය තියන තැනට ගිහිල්ලා දෙන්නෙක්, තුන්දෙනෙක්, හතර දෙනෙක් වගේ පිරිසක් ඒ ස්ථානයේ හිටපු සාදයට පැමිණිය පිරිසත් එක්ක බහින් බස්වීමක් වෙලා තියනවා. ඒ බහින් බස්වීම ඇතිවෙනකොට සහකාර පොලිස් අධිකාරිතුමාත්, මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාත් පැමිණිලා මේ ප්‍රහාරය ව්‍යාප්ත වෙලා තියනවා. ඒ වෙලාවේ පොලු අරගෙන උඩට නැඟලා ප්‍රහාරය එල්ල කරලා තියනවා. පොලීසියේ උසස් නිළධාරීන් ඇතුළු ඒ දෙන්නා සමඟ අනෙක් ආපු අය මැර ප්‍රහාර එල්ල කරමින් ඒ තරුණයා උඩ ඉඳලා ප්‍රහාරයට ලක් වෙලා බිමට ඇද දැම්මා කියන කථාව තමයි සිද්ධිය එතන ඇසින් දුටු අය කියන්නේ. මම සිද්ධිය ඇස් දෙකෙන් දැක්කේ නෑ. නමුත් එදා උදේ ඊට පස්සේ මමත් එතනට ගිහිල්ලා ගමේම ඉන්න ජනතාව කෝප වෙලා තරුණයෝ ඔක්කෝම උද්ඝෝෂණයක් කළා. ඒ උද්ඝෝෂණය කරන අවස්ථාවෙත් මම හිටියා. ඉඳලා මේක කොහොම හරි මැඩ පවත්වලා රාජකාරි මට්ටමින් නීතිය ක්‍රියාත්මක කරලා ඒ වැරදිකරුවන්ට දඬුවම් කරන්න කියලා තමයි මගේ තිබුණ ඉල්ලීමත්. මමත් ඒවාට සහභාගි වෙලා ඉල්ලීම කළේ ඒක. මහජන නියෝජිතයෙක් හැටියට අසාධාරණයක් වෙනකොට ගමේ කාට හරි, මොන පුද්ගලයා තරා තිරම මොනවා වුනත් අහිංසක කෙනෙකුට වැරැද්දක් වෙනකොට ඒකට සාධාරණීකරණය කරන්න තමයි අපි මහජන නියෝජිතයෝ හැටියට අපි පළාත් සභාවට අවිල්ලා ඉන්නේ. ඒක නිසා මම මේ අවස්ථාවේ දි ගරු සභාපතිතුමනි, සභාපතිතුමාගෙත් එදා උත්සවයක් ඇඹිලිපිටිය ජාතික පාසලේ තිබුණා. මම

ඒකට සහභාගී වුනා. මම හිතුවේ නෑ ඒ උත්සවයවත් කරගන්න අවස්ථාවක් උදා වෙයි කියලා. ඊට පස්සේ එස්.ටී.එෆ් එක ඇවිල්ලා ආරක්ෂාව දාගෙන නගරයේම ආරක්ෂාව තර කරලා දැනටත් අදටත් තවම ඒ තත්ත්වයේ තියනවා. නමුත් මම ප්‍රදේශයේ නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයා හැටියට මම ඒ සිද්ධිය හෙළා දකිමින් සාධාරණයක් ඉෂ්ඨ කරලා ඒ මිනී මරුවන්ට නිසි දඬුවම් කරන්න කියලා, මගේ ඉල්ලීම රාජකාරිය හරියට වෙන්න ඕන. රජය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට මේ පළාත් සභාවේ සභාපතිතුමාට මතක් කර සිටින්නේ. ඒක නිසා හරි කණගාටුදායක සිද්ධියක්. මේ වගේ අමානුෂික මරණ මේ රටේ තවත් ඉදිරියටත් වෙන්න ගියොත් එහෙම මම හිතන්නේ නීතිය කියන එක හරියට වෙන්න ඕන කියන එක තමයි මම කියන්නේ. ඒක තමයි මම ඉල්ලා සිටින්නේ. ඒක නිසා අහිංසක ජනතාව ජීවත් වෙන ප්‍රදේශයක්. ඒ වගේම ඔය පොලිස් නිළධාරීන් ඊට ඉස්සෙල්ලා වුනත් පන්සලකට වැලි ගෙනියන්නවත් ට්‍රැක්ටරයකට නැගපු හාමුදුරුවොත් බස්සවලා ඒ ට්‍රැක්ටර් රථය පවා ගෙනිහිල්ලා උසාවි දාලා දඩ ගහලා තිබුණා. වැලි කුඩයක් අහිංසක මනුස්සයෙක් ගොඩදාගන්නකොට උසාවි දාලා රු.50,000 ක් දඩ ගහනවා. ඒ වගේ අසාධාරණ විදිහට රාජකාරි කරපු පොලීසියක් තමයි ඇඹිලිපිටිය පොලීසිය. මම නම් කියන්නේ ඒ පොලිස් නිළධාරීන් ඇතුළු සියළුම පොලිස් නිළධාරීන් කොහාට හරි ට්‍රාන්සර් කරලා අලුත් පොලිස් නිළධාරීන් ටිකක් ඇඹිලිපිටිය පොලීසියට එවලා සාධාරණීකරණය කරලා ජනතාවට ජීවත්වෙන්න පුළුවන්

වාතාවරණයක් ඇති කරන්න කියලා තමයි මම ඉල්ලීම කරන්නේ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි අබේනායක මන්ත්‍රීතුමනි. ඔබතුමා වගේම අපි සියළුදෙනාම කම්පාවට පත්වුන සිද්ධියක් හැටියට තමයි අපිට ඒ සිද්ධිය දැන ගන්න ලැබුනේ. අපි සියළුදෙනාගේම බලාපොරොත්තුව හා විශ්වාසය තියෙන්නේ ඒ පිළිබඳව සාධාරණය ඉෂ්ඨ වෙයි කියලා. ඒ සඳහා අපි සියළුදෙනාම බලාගෙන ඉන්න බව මතක් කරමින්, දැන් වෙලාව මධ්‍යාහ්න 12.13 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අපි අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 ක් වූ ජනවාරි මස 26 වෙනි දින පෙ.ව.10.00 දක්වා කල් තබනවා.

අ/කලේ:

කංචන ජයරත්න

සභාපති

සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර

සභා ලේකම්

සබරගමුව පළාත් සභාව.

2016 ජනවාරි මස 21 වෙනි දින

සබරගමුව පළාත් සභා ලේකම් කාර්යාලයේදී ය.